# පාළිය (මාගධී) භාෂාවක් වශයෙන් සංවර්ධනය වීම පිළිබඳ වාග්විද්‍යාත්මක විවරණයක්

දිවුලපැලැස්සේ විමලානන්ද හිමි

## Abstract

Buddha's words in **Tipiṭaka** are combined about language; we first find different ideas in **Aṭṭhakathā**. In the commentaries where certain parts of the **Tipiṭaka** are quoted, the words of the Buddha are given in the Pali sound itself. The word used in the Canon for the language famous term is Nirutti. The terms sakāyanirutti (Anujānāmi bhikkhave sakāya niruttiyā Buddhavacanaṃ pariyāpuṇituṃ, **Cullavaggapāḷi II, 2006: 100**) and Janapadanirutti (Janapada niruttiṃ nābhiniveseyya, **Majjhimanikāya III, 2006: 484**) found in the Vinaya and Sutta Piṭakas are examples of this. By the 5th century AD, a new idea about the language of Buddha's words arose. It is evident from Ven. Buddhaghosa's commentary on Sakāya Nirutti. His word 'Ettha sakāya nirutti nāma sammāsambuddhena vuttappakāro māgadhako vohāro' (**Samantapāsādikā I, 1929: 272**) (Here sakāya niratti is the Māgadhī dialect spoken by the Buddha) was a subject of controversy among scholars from both sides. Investigating all the opinions about this, Kannimahara Sumangala Thero, who introduces Pali or Māgadhi language as a very old language used for academic activities spread over a large province of Northern India, thinks that this must have been a living language that could be understood by the people of Magadha, Kosala, Ujjayini etc. (**Sumangala, Kannimahara, 1964: 71-72**) Commenting on 'Anujānāmi bhikkhave sakāya niruttiya buddhavacanam pariyapuṇituṃ' mentioned in **Cullavaggapali Khuddakavatthukkhandhaka**, Ven. Buddhaghosa says that

Sakāya Nirutti means the Buddha's method of preaching Dhamma. (Ettha sakāya niruttiyā nāma sammā sambuddhena vuttappakāro māgadhako vohāro, **Samantapāsādikā I, 1929: 272**) But the Pabbajjāsutta of **the Suttanipāta** shows that the Buddha was not born in Magadha but sākya resident belonging to the kosala kingdom. (ādiccā nāma gottena sākiyā nāma jātiyā – tamhā kulā pabbajitomhi rāja na kāme abhipatthayaṃ, **Suttanipāta, 2006: 124**) According to this, the birth language of Buddha should not be Magadha but Kosala language. Considering these facts, Rhys Davids points out that Pali was the official language for mutual transactions in Kosala state. (**Pali English Dictionary, 2004: V**) Ven. Kannimahara Sumangala believes that although Ven. Buddhaghosa's definition of Sakāya nirutti is mostly confusing, it must have meant the same language. (**Sumangala, Kannimahara, 1964: 71-72**) The Araṇavibhaṅgasutta of the **Majjhimanikāya** shows that the name Janapada Nirutti refers to the different usage that existed in each place. It is clearer from the various names used to describe the bowl. (Janapada niruttiṃ nābhiniveseyya, sāmaññaṃ nātidhāveyya, **Majjhimanikāya, Araṇavibhaṅgasutta, 2005: 484**) The language used to introduce the Buddha's words is separated from other languages over time and it used in post canonical texts including the special names in **Aṭṭhakathā** such as māgadhika bhāsā, māgadhī nirutti, māgadhika vohāra etc. In particular, the commentators show a desire to use the name 'tantibhāsā' in common usage for the Pali language. (pahāyāropayitvāna tantibhāsaṃ manoramaṃ, **Dhammapadaṭṭhakathā I, 1919: 1**) In **Dāṭhāvaṃsa**, which is believed to have been written in 1211 AD, the Pali language is named as Māgadhī nirutti. (Nirittiyā māgadhikāya vuddhiyā – karomi dīpantaravāsinaṃ api, **Dāṭhāvaṃsa, 1914: 10**).

**සාරසංක්ෂේපය**

ත්‍රිපිටක බුද්ධ වචනය සංග්‍රහ වී ඇති භාෂාව පිළිබඳ විවිධ අදහස් ප්‍රථමයෙන් අපට හමු වන්නේ අට්ඨකථා තුළිනි. අටුවාවල

ත්‍රිපිටකයේ ඇතැම් කොටස් උපුටා දක්වන තැන්වල පාළි ශබ්දයෙන් ම බුද්ධ වචනය ගෙනහැර දක්වයි. භාෂාව සඳහා පෙළෙහි යෙදී ඇති ප්‍රකට වචනය නිරුත්ති යන්න යි. විනය හා සූත්‍ර පිටකවල දී හමුවන සකාය නිරුත්ති, (අනුජානාමි භික්ඛවෙ සකාය නිරුත්තියා බුද්ධ වචනං පරියාපුණිතුං, **චුල්ලවග්ගපාළි II, 2006: 100)** හා ජනපද නිරුත්ති, (ජනපද නිරුත්තිං නාභිනිවෙසෙය්‍ය, **මජ්ඣිමනිකාය III, 2006: 484)** යන යෙදුම් ඊට නිදසුන් ය. ක්‍රි.ව. පස්වන සියවස වන විට බුද්ධවචනයෙහි භාෂාව පිළිබඳ නව අදහසක් උද්ගත විය. එය බුද්ධඝෝෂ හිමියන්ගේ සකාය නිරුත්තිය පිළිබඳ විවරණයෙන් ප්‍රකට වේ. උන්වහන්සේගේ 'එත්ථ සකාය නිරුත්ති නාම සම්මාසම්බුද්ධෙන වුත්තප්පකාරො මාගධකො වොහාරො' (**සමන්තපාසාදිකා I, 1929: 272**) මෙහි සකාය නිරුත්ති යනු බුදුරජුන් විසින් ප්‍රකාශ කරන ලද මාගධී ව්‍යවහාරය යි යන ප්‍රකාශය පෙරා'පර දෙදිග උගතුන්ගේ මතභේදයට ලක් වූවකි. මේ පිළිබඳව ඇති සියලු මතයන්ම විමර්ශනයට භාජනය කරමින් පාළිය හෙවත් මාගධී බස උතුරු ඉන්දියාවේ විශාල ප්‍රදේශයක පැතිර පැවති ඉතාමත් පැරණි ශාස්ත්‍රීය කටයුතු සඳහා භාවිත වූ භාෂාවක් වශයෙන් හඳුන්වා දෙන කන්නිමහර සුමංගල හිමියෝ මෙය මගධ, කෝසල, උජ්ජයිනි ආදි විශාල ප්‍රදේශයක ජනයාට තේරුම් ගත හැකි ජීව භාෂාවක් වන්නට ඇතැයි අදහස් කරති. (**සුමංගල හිමි, කන්නිමහර, 1964: 71-72**) **චුල්ලවග්ගපාළි බුද්දකවත්ථුක්ඛන්ධකයෙහි** සඳහන් වන 'අනුජානාමි භික්ඛවෙ සකාය නිරුත්තියා බුද්ධවචනං පරියාපුණිතුං' යන්න විවරණය කරන බුද්ධඝෝෂ හිමියෝ සකාය නිරුත්තියා යන්නෙන් අදහස් කර ඇත්තේ බුදුන් වහන්සේගේ දේශනා මාධ්‍ය වූ මාගධික ව්‍යවහාරය බව පවසති. (එත්ථ සකාය නිරුත්තියා නාම සම්මා සම්බුද්ධෙන වුත්තප්පකාරො මාගධකො වොහාරො, **සමන්තපාසාදිකා I**, 1929: 272) එහෙත් බුදුන් වහන්සේ මගධයෙහි උපන්නෙකු නො වන අතර කෝසල රාජ්‍යයට අයත් ශාක්‍ය ජානපදිකයෙකු බව සුත්තනිපාතයෙහි පබ්බජ්ජා සූත්‍රයෙහි දැක්වේ. (ආදිච්චා නාම ගොත්තෙන සාකියා නාම ජාතියා - තම්හා කුලා පබ්බජිතොම්හි රාජ න කාමෙ අභිපත්ථයං, **සුත්තනිපාත, 2006: 124**).

මේ අනුව බුදුන් වහන්සේගේ ජන්ම බස විය යුත්තේ මාගධිය නොව කෝසල භාෂාව යි. මෙම කරුණු සලකාලමින්

රීස් ඩේවිඩ්ස් මහතා පෙන්වා දෙනුයේ පාලිය කෝසල රාජ්‍යයෙහි අන්‍යෝන්‍ය ගනුදෙනු සඳහා පැවැති රාජ්‍ය භාෂාව බව යි. (**Pāli English Dictionary, 2004: V**) බුද්ධඝෝෂ හිමියන් සකාය නිරුත්ති යන්නට සපයන නිර්වචනය බොහෝ දුරට ව්‍යාකූල වුවත් ඉන් අදහස් කරන්නට ඇත්තේ ද මේ භාෂාවම බව කන්නිමහර සුමංගල හිමියෝ අදහස් කරති. (**සුමංගල හිමි, කන්නිමහර**, **1964: 71-72**) ජනපද නිරුත්ති යන නාමයෙන් හැඟවෙන්නේ එක් එක් ප්‍රදේශයකට අදාළව පැවති විවිධ ව්‍යවහාරයන් බව **මජ්ඣිමනිකායේ** අරණවිභංග සූත්‍රයේ දැක්වේ. පාත්‍රය හැඳින්වීම සඳහා දක්වා ඇති විවිධ නාමයන්ගෙන් ඒ බව වඩාත් පැහැදිලි වේ. (ජනපද නිරුත්තිං නාභිනිවෙසෙය්‍ය, සාමඤ්ඤං නාතිධාවෙය්‍ය, **මජ්ඣිමනිකාය, අරණවිභංග සුත්ත, 2005: 484**) බුද්ධවචනය හැඳින්වීම සඳහා භාවිත භාෂාව කාලයාගේ ඇවෑමෙන් අන්‍ය භාෂාවන්ගෙන් වෙන් කොට හැඳින්වීම සඳහා මාගධික භාසා, මාගධී නිරුත්ති, මාගධික වොහාර ආදි විශේෂ වූ සංඥා නාම අට්ඨකථා ඇතුළු පශ්චාත්කාලීන කෘතිවල භාවිත කෙරේ. විශේෂයෙන් එහි දී අට්ඨකථාචාරීහු 'තන්තිභාසා' යන නාමය පාලි භාෂාව හැඳින්වීම පිණිස පොදු වශයෙන් යොදා ගැනීමට අභිරුචියක් දක්වති. (පභායාරොපයිත්වාන තන්තිභාසං මනොරමං, **ධම්මපදට්ඨකථා I, 1919: 1**) ක්‍රි.ව. 1211 දී රචිත යැයි සැළකෙන **දාඨාවංසයෙහි** පාලි භාෂාව හඳුන්වා ඇත්තේ මාගධි නිරුත්ති යනුවෙනි. (නිරුත්තියා මාගධිකාය වුද්ධියා - කරොමි දීපන්තරවාසිනං අපි, **දාඨාවංස**, 1914 **:**10).

**යතුරු පදඃ** - සකාය නිරුත්ති, මාගධික භාසා, මාගධී නිරුත්ති, මාගධික වොහාර, තන්තිභාසා

## හැඳින්වීම

'පාළි' යන්න භාෂාර්ථය සඳහා යොදා ඇත්තේ අට්ඨකථා යුගයට පසුව ය. පාළි ශබ්දයේ අර්ථය හා ඉතිහාසය පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන වැදගත් කරුණක් ඇත. එනම් ක්‍රි.ව. 14 වැනි සියවස තෙක් භාෂාව යන අර්ථයෙන් පාළි ශබ්දය ව්‍යවහාර ප්‍රාප්ත නොවූ බව යි. පාළි ශබ්දය භාෂාර්ථයෙන් මුලින්ම යෙදී ඇත්තේ 14 වැනි සියවසේ රචිත **රසවාහිනියේ** (හිතාය පරිවත්තෙසි පජානං පාළි

භාසතො, **රසවාහිනී, 2004: 1**), (**Dictionary of Pāli Proper Names III, 1997: 718**) බැවින් පාලි ශබ්දයේ භාෂාර්ථය වඩාත් නූතන බව කිව යුතුය. පාළි යන වචනය ත්‍රිපිටකය තුළ යෙදී ඇත්තේ බුද්ධ වචනය හෝ භාෂාව හැඟවීම සඳහා නොවේ. 'සබ්බපාළිඵුල්ල' යන වදනෙහි පාළි යන්නෙහි අර්ථය පේළිය යනුවෙන් අර්ථවත් වූ බව **මජ්ඣිමනිකායෙහි** දැක්වේ. (**මජ්ඣිමනිකාය**, 2005: 508) මෙම අර්ථය ම අම්බපාලි, දන්තපාලි, කණ්ණපාලි යන තැන්වල ද දක්නට ලැබේ. එසේ භාවිත වී ඇත්තේ පාළි ශබ්දයේ පදගතාර්ථය යි. මගධ ක්ෂේත්‍රයෙහි ස්වරූපය දක්වෙන තැන සඳහන් 'පාලිබද්ධ' යන පදයෙන්, අද්දසා ඛො භගවා මගධක්ඛෙත්තං අච්චිබද්ධං පාලිබද්ධං මරියාදා බද්ධං සිංඝාටක බද්ධං..., (**මහාවග්ගපාලි II, 2006: 708**) පාළි යන්නෙහි අර්ථය ද පෙළ යනාර්ථය බව මහාවග්ගපාළියෙන් පැහැදිලි වේ. 12 වෙනි සියවසේ රචිත **අභිධානප්පදීපිකාවේ** පාළි ශබ්දයට බුද්ධ වචනය යන අර්ථය සමඟ 'පඞ්ක්ති' යන අර්ථය ද ලබාදෙයි. (සෙතුස්මිං තන්ති පන්තීසු නාරියං පාලි කථ්‍යතෙ, **අභිධානප්පදීපිකා**, 1998:171) පණ්ඩිත විධුශේඛර භට්ටාචාර්යයන් ද පාලි ශබ්දයේ අර්ථය 'පංක්ති' බව දක්වයි. (**The Āgamaśāstra of Gandapāda, vidhushekhara Bhattacharya, 1989: Introduction**) එහෙත් මේ අදහස ජගදීශ කාශ්‍යප හිමියන්ගේ විචාරයට ලක්වී ඇත. (**බුද්ධදත්ත හිමි, පොල්වත්තේ**, 3) එසේම පාළි ශබ්දයේ අර්ථය පංක්ති යනුවෙන් ගතහොත් 'උදානපාළි' වැනි ප්‍රයෝගවලදී 'උදාන පංක්තිය' ලෙස ග්‍රහණය වන අතර එයින් නිශ්චිත අර්ථයක් ගත නොහැකි ය. එනිසා පාළිය සඳහා පංක්ති අර්ථය එහි මෞලික ස්වරූපය හා ගෙනයෑමට හැකියාවක් නොමැත.

**පර්යේෂණ ගැටලුව**

පාළි යන්න භාෂාර්ථයෙන් අර්ථවත් වීමේ යුක්තියුක්තතාව කෙසේ ද? යන්න පාළි සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරෙන් විමර්ශනය කෙරේ.

**පර්යේෂණ අරමුණු**

බුද්ධවචනය විවරණය කිරීමේ දී බුදුන් වහන්සේ විසින් භාවිත භාෂාව නිරුක්ති, මාගධී නාමයන්ගෙන් හැඳින්වීමත් මුල්කාලයේ දී පාලි යන්නෙන් භාෂාර්ථය අර්ථවත් නොවීමත් පසුකාලීන සාහිත්‍ය

කෘතිවල භාෂාර්ථය දැක්වීම සඳහා පාළි යන්න භාවිතයට ගැනීමත් යන අරමුණු පැහැදිලි කරගැනීම මෙම පර්යේෂණ ලිපියේ අපේක්‍ෂාවයි.

**පර්යේෂණයේ වැදගත්කම**

බුද්ධ දේශනාව සංගෘහිත භාෂාව පාළි භාෂාව වශයෙන් වත්මන් සියලුම විද්වතුන් හඳුන්වනු ලබන පොදු නාමයයි. එහෙත් මුල් බුදුසමය තුළ පාළි යන්නෙන් භාෂාර්ථයක් අර්ථවත් නොවූ බවත් පාළි යන්නෙන් වෙනත් විවිධ අර්ථ උද්දීපනය වූ බවත් පැහැදිලි වේ. පසුකාලීනව බුද්ධදේශනාව හැඳින්වීම සඳහා ම මෙම භාෂාව පාළි නාමයෙන් හඳුන්වන්නට යෙදුණි. ආරම්භයේ දී වෙනත් අර්ථයක් වෙනුවෙනුත් පසුව භාෂාර්ථයක් වෙනුවෙනුත් පාළි යන්න යෙදුණු ආකාරය විමර්ශනය කිරීම වැදගත් ප්‍රස්තුතයක් වනු නිසැකය. එබැවින් වාග්විද්‍යානුකූලව කරුණු විමර්ශනය කරමින් තත් පර්යේෂණය සිදුකරනු ලැබේ.

**පර්යේෂණ පසුබිම**

ත්‍රිපිටක දේශනා තුළ දී පාළි යන්න කිනම් අර්ථයකින් භාවිත වූ ආකාරයත් **අට්ඨකථා** කෘතිවල පාළි යන්නෙන් අර්ථවත් වූයේ කිනම් විෂය පථයක් ද යන්න වගත් ටීකා සහ පශ්චාත් පාළි කෘතිවල පාළි යන්න භාවිත වූ ආකාරයත් පසුබිමෙහි තබාගෙන පාළි යන්නෙහි ඓතිහාසික සම්භවය හා විකාශය පිළිබඳ කරුණු විශ්ලේෂණය කෙරේ.

**පර්යේෂණ සීමා**

**සූත්‍ර, අට්ඨකථා, ටීකා** සහ **ත්‍රිපිටක** සාහිත්‍යය පිළිබඳ විමර්ශනය කරමින් තත් ග්‍රන්ථවල අන්තර්ගතයන්හි පාළි යන්න භාවිත ආකාරය සීමා කොටගෙන මෙම විමර්ශනය සිදුකෙරේ.

**සාහිත්‍ය විමර්ශනය**

පාළි භාෂාව පිළිබඳ සිදුකර ඇති පර්යේෂණ විශාල ප්‍රමාණයක් වෙයි. පෙළ, අට්ඨකථා, ටීකා, පාලි ව්‍යාකරණ හා ප්‍රකරණ හැරුණු කොට පසුකාලීන විද්වතුන් විසින් විවිධ විමර්ශනාත්මක පර්යේෂණ මේ සම්බන්ධව සිදුකර ඇත. හැකිතාක් ඒ සියල්ල කෙරෙහි අපගේ

අවධානය යොමු කරමින් මෙම පර්යේෂණය සඳහා කරුණු ගොනුකර ගැනීම සිදුකෙරේ. ඒ අනුව හරතසිංහ උපාධ්‍යාය විසින් සම්පාදිත හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමියන් විසින් පරිවර්තිත **පාලි සාහිත්‍යයේ ඉතිහාසය කෘතියෙහි** පළමු පරිච්ඡේදය මෙම මාතෘකාව සම්බන්ධයෙන් මනා සාධාරණයක් ඉටුකරනු ලබයි. එහි අවසාන නිගමනය වනුයේ මගධයේ පැවැති භාෂාව බුදුන් වහන්සේගේ දේශනා මාධ්‍යය වශයෙන් තෝරාගත් අතර පාළිය ප්‍රාකෘත භාෂා ගණයක් වශයෙන් සංවර්ධනය පත්වන්නට ඇති බවයි. එසේම හොරණ කහටපිටියේ රාහුල හිමි විසින් සම්පාදිත **ශ්‍රී ලංකාවේ පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක් නිබන්ධය** ඉතා වැදගත් තොරතුරු රැසක් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබේ. එහි සාහිත්‍යාත්මක පදනමක සිට තොරතුරු රාශියක් ඉදිරිපත් කරනු ලැබේ. එසේම කන්නිමහර සුමංගල හිමියන් විසින් සම්පාදිත **පාලි භාෂා විමර්ශනය** පාලිය වාග්විද්‍යාත්මකව විමර්ශනයේ දී වැදගත් තවත් මූලාශ්‍ර කෘතියකි. තව ද මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමියන් විසින් සම්පාදිත **මධ්‍යකාලීන පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය, රූපසිද්ධිය හා පයෝගසිද්ධිය පිළිබඳ තුලනාත්මක හා ඓතිහාසික අධ්‍යයනය** ද ප්‍රස්තුත මාතෘකාවට විශාල පිටුවහලක් වනු ඇත. මේ හැරුණු කොට මේ සම්බන්ධව ලියැවී ඇති වෙනත් ලිපි, සඟරා ආදිය කෙරෙහිද අවධානය යොමු කරමින් සාහිත්‍ය විමර්ශනය සිදුකරමින් තත් පර්යේෂණය සිදුකෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

සාහිත්‍යමය මූලාශ්‍රය පදනම් කරගෙන සපයාගත් තොරතුරු ඓතිහාසික හා වාග්විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විමර්ශනය කිරීම මෙහි දී භාවිත පර්යේෂණ ක්‍රමවේදයයි. ග්‍රන්ථ සංධාර විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ දත්ත රැස්කිරීම සිදුකර ඇත.

**සෛද්ධාන්තික රාමුව**

තන්ති, නිරුත්ති, මාගධී හා පාළි යන වාග් මාලාව ඔස්සේ පාළියෙහි සම්භවය හා විකාශය ක්‍රමිකව සිදු වූ ආකාරය සෛද්ධාන්තික රාමුවේ සිට පර්යේෂණය සිදුකරනු ලැබේ.

**උපන්‍යාසය**

මුල් අවධියේ දී පාළි යන්නෙන් බුද්ධවචනය, පෙළ දහම, පාඨය වැනි අර්ථ උද්දීපනය වුවත් පසුකාලීනව පාළි යන්න මාගධී භාෂාව අර්ථගැන්වීම වෙනුවෙන් ම යෙදී ඇති ආකාරය පැහැදිලි වේ.

**සාකච්ඡාව**

බුද්ධඝෝෂාචාර්යයන් **විසුද්ධිමග්ගයේදීත්** අනෙකුත් **අට්ඨකථාවන්හිදීත්** පාළි ශබ්දය බහුල ලෙස ව්‍යවහාර කොට ඇත. (**විසුද්ධිමග්ග,** 1919: 336) **විසුද්ධිමග්ගයෙහි** කම්මට්ඨාන ගහන නිද්දේසයේ දීත් (සබ්බාකාරෙන නෙව පාළියං න අට්ඨකථායං ආගතං) ඛන්ධ නිද්දේසයේ දීත් (ඉමානි තාව පාළියං ආගතරූපානෙව අට්ඨකථායම්පන බලරූපං) යන තැන්හි දී පාළි ශබ්දය යොදා තිබෙනුයේ භාෂාර්ථයෙහි නොව, ත්‍රිපිටක ධර්මය සඳහා ය. **මහාවංසයෙහි 37 වෙනි පරිච්ඡේදයේ** දී බුද්ධඝෝෂාචාරීන් පිළිබඳ විස්තර ඉදිරිපත් කරන තැන (පාළිමත්තං ඉධානීතං නත්ථි අට්ඨකථා ඉධ) ද එහි ම 'පාළිමහා'භිධම්මස්ස අත්ථමස්ස න සො'ධිගා' යන තැන ද පාළි ශබ්දය යොදා තිබෙනුයේ ත්‍රිපිටකය සඳහා ය. එම අවස්ථාවල දී ප්‍රධාන වශයෙන් පාළි ශබ්දයෙන් අර්ථ දෙකක් ගම්‍ය වේ. (**භරතසිංහ උපාධ්‍යාය,** 2003: 1) එනම්, බුද්ධවචනය හෝ මූල ත්‍රිපිටකය සහ පාඨ හෝ මූල ත්‍රිපිටකයේ පාඨ යන අර්ථ දෙකයි. මෙම අර්ථ තුළින් ත්‍රිපිටකය හා ත්‍රිපිටකයේ පාඨ අතර භේදය දැක්වීමෙහි ලා පාළි ශබ්දය යෙදූ බව පැහැදිලිව අවබෝධ කරගත හැකි වේ. ඇතැම් විටෙක බුද්ධඝෝෂ හිමියෝ පෝරාණ අට්ඨකථාවලින් වෙනස්කම් දැක්වීම සඳහා මූල ත්‍රිපිටකයෙන් ඇතැම් කොටස් උපුටා දක්වති. එබඳු අවස්ථාවල දී බුද්ධවචනය හෝ මූල ත්‍රිපිටකය හැඳින්වීමට පාලි ශබ්දය භාවිත කර ඇත.

**දීඝනිකාය අට්ඨකථාව වන සුමංගලවිලාසිනියේ** සාමඤ්ඤඵල සූත්‍ර වර්ණනාවෙහි (**සුමංගලවිලාසිනි,** 1918: 20) 'මහතා රාජානුභාවෙන' යන පදයට විවරණ සපයමින් මුලින් ම එහි සාමාන්‍ය අර්ථය ඉදිරිපත්කර ඇත. අනතුරුව ඒ සඳහා පාඨාන්තරයක් නිර්දේශ කරමින් 'මහච්චා ඉතිපි පාළි' යනුවෙන් 'මහතා' යන්නට 'මහච්චා' යනුවෙන් ද පාඨයක් ඇති බව දක්වයි. මෙයින් පාළි යන්න පාඨ යන අර්ථය

සඳහා ම යෙදුණු බව පැහැදිලි ය. ඇතැම් විටෙක එක් පාඨයකට ඇති තවත් සමාන පාඨයක් දැක්වීමේ දී පාඨ ශබ්දය ද භාවිතකර ඇත. 'සෙතකානි අට්ඨීනි...සෙතට්ඨිකාතිපි පාඨො (**සමන්තපාසාදිකා, 116**), අපගතකාලකො...අපගතකාලකොතිපි පාඨො' (**සමන්තපාසාදිකා, 133**) යන නිදර්ශනයේ පාඨ ශබ්දයත් මුල් නිදර්ශනයේ පාලි ශබ්දයත් සමානාර්ථවාචී ය. එයින් පාළි ශබ්දයේ පාඨාර්ථය මනාව පැහැදිලි වේ.

ඛුද්දකනිකායේ ග්‍රන්ථ කිහිපයකට ම අට්ඨකථා රචනා කළ ධම්මපාලාචාර්යයන් විසින් ද '**පරමත්‍ථදීපනී**' අටුවාවන්හි පාළි ශබ්දය මූල ත්‍රිපිටකයේ 'පාඨ' යනාර්ථයෙන් ම යොදා ඇත. විසුද්ධිමග්ගයේ පාළි ශබ්දය යොදා ඇති බොහෝ තැන්හි දී පටිසම්භිදාමග්ගයෙන් උද්ධෘත කොටස් සඳහන් වන ආකාරය රීස් ඩේවිඩ්ස් මැතිනිය පෙන්වා දෙයි. ත්‍රිපිටකය රචනා වූයේ මගධ දේශයට අයත් මාගධ භාෂාවෙන් බව අටුවාචාරීන්ගේ මතය යි. ඒ අනුව ස්වාභාවික නිරුක්තිය වූ සියලු මනුෂ්‍ය වර්ගයාගේ මූල භාෂාව වූ මගධ භාෂාවෙහි ප්‍රභේදගත ඤාණය නිරුත්තිපටිසම්භිදා බව **විසුද්ධිමග්ගයේ** දී නිරුත්තිපටිසම්භිදාව විස්තර කරමින් පෙන්වා දෙයි. (සභාවනිරුත්තියා මාගධිකාය සබ්බසත්තානං මූලභාසාය පභෙදගතං ඤාණං නිරුත්තිපටිසම්භිදා, **විසුද්ධිමග්ග, 330**) එසේ ම 'දේසභාසා' අර්ථකථනය කරන බුද්ධඝෝෂාචාරීහු 'දේසභාසා නම් පන්සියයක් භාෂාවන්හි දක්ෂ භාවය බවත් විශේෂයෙන් මාගධි භාෂාවෙහි දක්ෂ භාවය බවත් සඳහන් කරති. (දෙසභාසා නාම එකසතවොහාරකුසලතා, විසෙසෙන පන මාගධිකෙ කොසල්ලං, **විසුද්ධිමග්ග, 331**)

පාළි භාෂාව පිළිබඳ අර්ථකථනයක් ඉදිරිපත් කරන මජ්ඣිමනිකාය ටීකාව ප්‍රධාන වශයෙන් අර්ථත්‍රයක් දක්වයි.

1. උසස් වූ සීල, සමාධි, ප්‍රඥා ආදී අර්ථයන්ගේ ප්‍රත්‍යක්ෂාවබෝධනය සිදුකිරීම (උක්කට්ඨානං සීලාදි අත්‍ථානං බොධනතො)

2. ස්වභාව නිරුත්ති වශයෙන් බුද්ධාදී උත්තමයන් විසින් දේශනා කිරීම (සභාවනිරුත්තිවසෙන බුද්ධාදීහි භාසිතත්තා)

3. ඉතා ප්‍රකට වූ බුද්ධාදී වචනයන්ගෙන් ප්‍රබන්ධ (පකට්ඨානං වචනප්පබන්ධානං ආලීති පාළි)

ක්‍රි.ව. 4 සියවසේ රචිත යැයි සැලකෙන **දීපවංසයේ** ද 'බුද්ධවචනය' යන අර්ථයෙන් පාළි ශබ්දය යෙදී තිබේ. (පිටකත්තය පාළිඤ්ච තස්සා අට්ඨකථම්පි ච - මුඛපාඨෙන ආනෙසුං පුබ්බෙ භික්ඛූ මහාමති, **දීපවංසො, 1959:20**) 13 වැනි සියවසේ දී පමණ **මහාවංසයේ ද්විතීය භාගය** ලෙසින් රචිත **චූලවංසයේ** එන 'පාළිමත්තං ඉධානීතං - නත්ථි අට්ඨකථා ඉධ' යන්නෙහි යෙදී ඇති පාළි ශබ්දය මූල ත්‍රිපිටකය යන අර්ථය ගෙන දෙන්නකි. එයින් ප්‍රකාශ වන්නේ මූලික ත්‍රිපිටකය පමණක් ලක්දිවට ගෙන එන ලද බවත් ඒවායේ අට්ඨකථා නො ගෙනා බවත් ය. චූලවංසයට සමකාලීන සේ සැලකෙන සද්ධම්මසංගහයේ ද (**Law.B.C.,**1941) ත්‍රිපිටකය යන අර්ථයෙන් පාළි ශබ්දය යෙදී තිබේ. වට්ටගාමිණී අභය නිරිඳුන් මහාවිහාර භික්ෂූන් හමු වූ අවස්ථාවේ පවසනුයේ මුඛපාඨ වශයෙන් පාරම්පරිකව පවත්වාගෙන ආ ත්‍රිපිටක බුද්ධ වචනයත්, සියලු අට්ඨකථාත්, පාළියත් පොත්වල ලියා තැබීම අනාගත සුරක්ෂිතතාවය පිණිස හේතු වන බව ය. (මුඛපාඨතො තෙපිටකං බුද්ධවචනං සබ්බං සාට්ඨකථඤ්ච පාළිඤ්ච පොත්ථකෙසු ලිඛාපෙතබ්බං භවෙය්‍යාති, **Saddhammasangaho, 1981:48)** මේ අනුව ක්‍රි.ව. 4 සියවසේ සිට 14 වැනි සියවස දක්වා පාළි ශබ්දය බුද්ධවචනය, මූල ත්‍රිපිටකය හෝ එහි පාඨය යන අර්ථ සඳහා යෙදී ඇති ආකාරය පැහැදිලි වෙයි. මේ අයුරින් පාළි ශබ්දයේ යම් අර්ථයක් ප්‍රකාශිත ද එය ආධාර කරගනිමින් විද්වත්හු පාලි ශබ්දයේ නිරුක්තිය පිළිබඳ අදහස් තුනක් ඉදිරිපත් කරති. (**පාලි සාහිත්‍ය ඉතිහාසය**, 3)

1. බුද්ධඝෝෂ අටුවාවල පාළි ශබ්දය බුද්ධවචනය නැතහොත් මූල ත්‍රිපිටකය යන අර්ථයෙහි යෙදීම.

2. පාලි ශබ්දයේ පාඨ යන අර්ථය පිළිබඳ හැඟීම.

3. සංස්කෘතයට අනුව පාළි යන්නෙහි අර්ථය පෙළ වශයෙන් ගෙන බුද්ධඝෝෂාචාරීන් යොදන ලද පාළි ශබ්දයේ අර්ථය සමඟ එකතු කිරීමට උත්සාහ කිරීම.

භික්ෂු ජගදීශ කාශ්‍යප හිමියන් පෙන්වා දෙන්නේ බුද්ධෝපදේශ සඳහා භාවිත මුල්ම රූපය 'පරියාය' ශබ්දය බවයි. ත්‍රිපිටකයේ සඳහන් පාඨ කිහිපයක් ඇසුරින් ඒ බව පැහැදිලි කරදෙයි. 'කො නාමො අයං භන්තෙ ධම්මපරියායොති' **(දීඝනිකාය I, 2007:80)** 'භගවතා අනෙක පරියායෙන ධම්මො පකාසිතො' යන අවස්ථා ඉදිරිපත් කළ එතුමා පසුව මෙම පරියාය ශබ්දයෙහිම ර > ල වීමෙන් පලියාය විය. අනතුරුව 'පලි' උපසර්ගයේ ප්‍රථමාක්ෂරය දීර්ඝ වී 'පාලියාය' විය. එහි ම සංක්ෂිප්ත රූපය පාලි වී එය බුද්ධ වචනය නැතහොත් මූල ත්‍රිපිටකය යනාර්ථයෙන් යෙදුණු බව එතුමාගේ අදහස යි. **(Kāsyapa Jagadīsa Bhikkhu, 1975)**

පාළි යන වචනය විශේෂ භාෂාවක් හැඟවීමට යොදා ගැනීම සිදුවනුයේ ක්‍රමයෙනි. ධම්මපදට්ඨකථාවේ ද (ධම්මපදට්ඨකථා **I**, 1919: 1) පාලි භාෂාව හැඳින්වීමට යෙදී ඇත්තේ 'තන්තිභාසා' (තන්තිභාසං මනොරමං) යන්න යි. මෙම 'තන්ති' ශබ්දය වෛදික සම්ප්‍රදාය හරහා බෞද්ධයන් අතරට එක් වූ වචනයකි. සූත්‍ර වාචී තන්ත්‍ර ශබ්දය ද සූත්‍ර (නූල්) ශබ්දය මෙන්ම 'ආගමික ඉගැන්වීම් සංක්ෂිප්ත වාක්‍යයන්ට නගා පරිහරණයට පහසු කර සාදා ගත් කියමන් විශේෂයක්' යන අර්ථය මෙයින් ගෙන දෙයි. එබඳු සූත්‍ර ක්‍රමයකින් රචිත ගෞතම, බෞද්ධායන, ආපස්ථම්භ ආදී ධර්ම සූත්‍ර රාශියක් දක්නට ලැබේ. තාන්ත්‍රිකාදීන් ද තන්ත්‍ර යනුවෙන් හඳුන්වන කෙටි වැකිවලින් යුත් සූත්‍ර රාශියක් සකසා ඇත. එහෙත් ඒවා වෛදික සූක්තවලට වඩා වෙනස් ය. ථේරවාද සූත්‍ර පිටකය තුළ ද කිසියම් ශාස්ත්‍රීය පිළිවෙළකට ධර්ම කොට්ඨාස සකස් කොට ඇති නිසා 'තන්ති' යන්න එයට ද නාමයක් ලෙස යෙදී ඇතැයි විමල විජයසූරිය ශූරීහු පෙන්වා දෙති. **(විජයසූරිය, විමල, 1968: 46)**

භික්ෂු සිද්ධාර්ථයන්ගේ මතය වනුයේ සංස්කෘත 'පාඨ' ශබ්දයෙන් පාළි ශබ්දයේ මූල උද්ගමය සිදු වූ බවයි. ධ්වනි පරිවර්තනයෙන් පාඨ > පාල විය. සංස්කෘතයේ මූර්ධන්‍ය අක්ෂර පාලි හා ප්‍රාකෘත භාෂාවන්හි ළ් බවට පත්වෙයි. ආටවික > ආළවික, වෙණු > වෙළු, එඩක > එළක, දෘඪ > දළ්හ වන්නාසේ ම පාඨ > පාළ විය. අන්ත්‍ය ස්වරයේ පරිවර්තනයෙන් පාළ > පාළි වෙයි. ළ සහ ල ශබ්ද උච්චාරණයේ වෙනසක් නොමැති නිසා පාලි ශබ්දය භාවිතයට පැමිණි බව එතුමාගේ අදහසයි. භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා

කරනු ලබන අර්ථය ද ව්‍යවහාරය ද දක්වන බැවින් ශබ්දයට පාළි නම් වන බව ගණ්ඨිපද යැයි කියන ලදැයි **අභිධම්මට්ඨකථාවේ** දැක්වෙයි. (භගවතා වුච්චමානස්ස අත්ථස්ස වොහාරස්ස ච දීපනතො සද්දොයෙව පාළි නාමාති ගණ්ඨිපදෙසුපි වුත්තං අභිධම්මට්ඨකථාය ලිඛිතෙ සීහලගණ්ඨිපදෙ පන ඉදං වුත්තං, **සාරත්ථදීපනී ටීකා, 1914: 65)**

වාග් විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් බැලීමේ දී කාශ්‍යප හිමියන්ගේත් සිද්ධාර්ථයන්ගේත් මත දොස් රහිත වුවත් ඓතිහාසික දෘෂ්ටියකින් බැලීමේ දී යම් දුර්වලතාවක් දැකිය හැකිය. අටුවාවන්හි 'ඉතිපි පාඨො' යැයි දැක් වූ මුත් 'ඉතිපි පාලො' යැයි සඳහන් වීමක් නොවෙයි. ඓතිහාසික දෘෂ්ටියෙන් යුක්ති සහගත වන්නේ 'ඉතිපි පාළි' යන්න පසුවම මිස ඊට පළමු නොවන බවයි. ඒ අනුව 'ඉතිපි පාඨො' පසුව ලිවීම ආරම්භ වන්නට ඇත. එවිට ත්‍රිපිටකයේ පඨන පාඨන ප්‍රචාරය වැඩි වශයෙන් සිදුවන්නට ඇති බව රීස් ඩේවිඩ්ස් මැතිනිය පෙන්වා දෙයි. (**Rhys Davids:** 429-30)

මුලින්ම 'තන්ති' ශබ්දය යම් ත්‍රිපිටක ග්‍රන්ථයක් හැඳින්වීම සඳහා යෙදුණි නම් ඒ 'විනය තන්ති, විනය පාළි' වැනි අවස්ථාවන්වල දී ය. බුද්ධඝෝෂාචාරීන් සඟි අටුවා හතරේ දී ම පෙන්වා දෙන්නේ 'මනෝඥ වූ සිංහල භාෂාව ඉවත් කොට ත්‍රිපිටක පාලියට යෝග්‍ය වූ නිදොස් වූ භාෂාවට නඟමින්,' (අපනෙත්වාන තතො'හං සීහළභාසං මනොරමං භාසං, තන්තිනයානුච්ඡවිකං, ආරොපෙන්තො විගතදොසං, **සුමංගලවිලාසිනී:** 1) යනුවෙන් පාලි භාෂාව හෙවත් තන්ති භාෂාව යනු ත්‍රිපිටකයට ගැළපෙන භාෂාව යැයි සඳහන් කරයි. එහෙත් ධම්මපාලාචාරීහු 'තන්තිභාසා' නාමය යොදා ගනිමින් ස්වකීය ධම්මපදට්ඨකථාව 'සිංහල භාෂාවත් අධික විස්තරයත් වචන පිළිවෙළත් හැර මනෝඥ වූ තන්ති භාෂාවට නඟා' තං භාසං අතිවත්ථාරගතං'ච වචනක්කමං, පහායරොපයිත්වාන තන්තිභාසං මනොරමං, (**ධම්මපදට්ඨකථා I: 1**) යැයි සඳහන් කරති. ලක්දිව දී ත්‍රිපිටක භාෂාව හැඳින්වීම සඳහා භාවිත බහුල රූපය වූයේ 'තන්ති භාසා' යන්නයි. මාගධී, මාගධික භාසා, මාගධ නිරුත්ති, මාගධික වොහාර යන නාමයන් ද පාලි ශබ්දය භාෂාර්ථයෙන් භාවිත කරන්නට පෙර එම අර්ථය හැඟවීම පිණිස යොදා ගෙන තිබේ. මෙම ශබ්ද

ව්‍යවහාරයට පැමිණීම තුළින් අදහස් කෙරෙනුයේ ත්‍රිපිටකය ලියා ඇති භාෂාව මගධ දේශයේ කථාකළ භාෂාව බවයි. භාසා, නිරුත්ති, වොහාර යන පදවලින් භාෂාව යන අර්ථය ඉදිරිපත්වන අයුරු මෙම උද්ධෘතවලින් පැහැදිලි කරගත හැකිය.

'තං තත්‍ථ ගන්ත්වා සුත්වා ත්වං මාගධානං නිරුත්තියා පරිවත්තෙහි සා හොති සබ්බලොකහිතාවහා' (**විසුද්ධිමග්ග, නිදානකථා: 16 ගාථාව**) 'එත්‍ථ සකාය නිරුත්ති නාම සම්මාසම්බුද්ධෙන වුත්තප්පකාරො මාගධකො වොහාරො' (**සමන්තපාසාදිකා: 489**) 'සභාව නිරුත්තියා මාගධිකාය සබ්බසත්තානං මූලභාසාය' (**පටිසම්භිදාමග්ගට්ඨකථා: 4**).

මේ අයුරින් අටුවාචාරීහු පාළි භාෂාව යැයි සඳහන් කිරීම වෙනුවට මාගධී භාෂාව යැයි කීමෙහි යථාර්ථය පැහැදිලි ය. එනම් 'බුදුන්ගේ දේශනා පාළිය ඇතුළත් වූ මාගධී භාෂාව' යන එහි නියම අර්ථය ප්‍රකාශ වන හෙයිනි. (**ඤාණානන්ද හිමි, මාදෝවිට, 1963: 84**) බුද්ධඝෝෂ හිමියන් **සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ** දී බුදුන් වහන්සේ විසින් උපයුක්ත භාෂා ප්‍රයෝග මාගධියම බව පෙන්වාදෙයි. **විසුද්ධිමග්ගයේ** දී පවසනුයේ මාගධී භාෂාව ම සත්වයන්ගේ මූල භාෂාව බව යි. (මාගධිකාය සබ්බ සත්තානං මූලභාසාය, **විසුද්ධිමග්ග: 330**) එසේ ම 'මහාවිහාරවාචනාමග්ග' යන නාමය ද පාළි භාෂාව යන අර්ථය හැඟවීමට යොදන ලද බව ද අටුවාවලින් පැහැදිලි වේ. 'මහාවිහාරවාසීනං වාචනාමග්ග නිස්සිතං' (**ජාතකට්ඨකථා, 1928: 1**) යන ජාතකට්ඨකථා ගාථාවෙහි 'වාචනාමග්ග නිස්සිතං' යන්නට ගැටපද සපයන **ජාතක අටුවා ගැටපදය** (**ජාතක අටුවා ගැටපදය, 1943: 5**) ඒ සඳහා ඉදිරිපත් කරනුයේ 'පාළි මාර්ගය' වශයෙනි. මේ පාළි මාර්ග යනු පාලි භාෂාව යි. 10 වෙනි සියවසේ දී පස්වැනි කසුප් රජු විසින් කරන ලද **ධම්පියා අටුවා ගැටපදයෙහි** "තන්තිභාසං, පෙළබස්, මගධ බස්, යූ සේයි" (**ධම්පියා අටුවා ගැටපදය, 1974: 6**) යනුවෙන් දක්නට ලැබෙන පාඨය අනුව පාළි භාෂා යන්න එකල ව්‍යවහාරයේ පවතින්නට ඇතැයි සිතිය හැකි අතර ත්‍රිපිටකයේ භාෂාව යන අර්ථය දීම සඳහා භාවිත වූවක් බව ද එම නිර්වචනය අනුව සිතිය හැකිය.

**ධම්පියා අටුවා ගැටපදයෙහි** සඳහන් වූ 'පෙළ බස්' යන්නෙන් අදහස් වන්නට ඇත්තේ 'පෙළෙහි බස' ද නැතහොත් පෙළ බස (පාලි

භාෂාව) ද යනු අවිනිශ්චිත ය. එයින් පාළි භාෂාව අදහස් වන්නට ඇතැයි සැලකුව හොත් රසවාහිනියෙහි මුල් වරට යෙදුණු 'පාළිභාසා' යන ව්‍යවහාරයට **ධම්පියා අටුවා ගැටපදයේ** ආභාසය ලැබෙන්නට ඇතැයි කිව හැකිය. එහෙත් එය නිශ්චිත නිගමනයක් නොවේ. මේ පිළිබඳ අදහස් දක්වන බිමල චරණ ලෝ මහතාගේ අදහස වන්නේ පාළි භාෂා යන යෙදීම පළමුවෙන් ම කරන ලද්දේ යුරෝපීය විද්වතුන් විසින් ද නැතහොත් ලංකාවේ භික්ෂූන් විසින් ද යන්න තවම විවාදයට පාත්‍ර වී ඇති බවයි. **(Law, B.C. 1934: ix)** මේ අනුව වර්තමානයේ දී ද භාෂාවක් පොදු වශයෙන් හැඳින්වීම සඳහා මාගධී යන්නෙහි පර්යාය නාමයක් ලෙස පාළි ශබ්දය යොදා ගනු ලබන බැව් මේ පිළිබඳ පර්යේෂණ කළ විද්වතුන්ගේ පෙන්වාදීම යි. (**විජිතධම්ම හිමි, මැදගම්පිටියේ, 2010: 55**)

පාළි යන්නෙහි නිරුත්තිය ඉදිරිපත් කරන **විනයාලංකාර ටීකාව**, යමක් පාලනය කරයි ද, ආරක්ෂා කරයි ද එය 'පාළි' නම් වන පෙන්වාදෙයි. (අත්ථං පාලෙති රක්ඛතීති පාළි) එසේ ආරක්ෂා කරනුයේ පාලනය කරනුයේ අර්ථයම ය. (අත්‍ථං පාති) එනම් බුද්ධ වචනය යි. මේ අනුව **අභිධානප්පදීපිකාව** 'පාළි' ශබ්දය පාලනය කිරීමට නැතහොත් ආරක්ෂා කිරීම පිළිබඳ අර්ථයට සැලකිල්ලක් දක්වා ඇති බව පෙන්වාදෙයි. **අභිධානප්පදීපිකා සූචියෙහි** ද පාළි ශබ්දය වෙනුවෙන් මෙබඳුම නිර්වචනයක් ඉදිරිපත් කරයි. (පාතී රක්ඛතීති පාළි, පාළීති එකච්චෙ, තන්ති බුද්ධවචනං පන්ති පාළි, **අභිධානප්පදීපිකා සූචි, 1893: 234**) **දීපවංස, මහාවංස** ආදි ඉතිහාස ග්‍රන්ථයන්හි සඳහන් වනුයේ ත්‍රිපිටක පාලිය සහ අට්ඨකථා භාණක පරම්පරාවන්ගෙන් පැවත ගෙන එන බවත්, සත්ත්වයන්ගේ සිහිබුද්ධිය හීනවීම දැක ධර්මයේ චිරස්ථිතිය පිණිස ග්‍රන්‍ථ වශයෙන් ලේඛනාරූඪ කළ බවත් ය. (පිටකත්තය පාලිං ච තස්සා අට්ඨකථං පිච මුඛපාඨෙන ආනෙසුං පුබ්බෙ භික්ඛු මහාමති, හානිං දිස්වාන සත්තානං තදා භික්ඛු සමාගතා චිරට්ඨිතත්‍ථං ධම්මස්ස පොත්‍ථකෙසු ලිඛාපයුං, **දීපවංස, 20 පරි. 20/21 ගාථා, මහාවංස, 30 පරි. 100/101 ගාථා**)

භාෂා ලක්ෂණ අනුව විමසීමේ දී මාගධියේ ම සංවර්ධනයක් වූ පාළි භාෂාව හේමචන්ද්‍ර, වරරුචි ආදි ප්‍රාකෘත ව්‍යාකරණඥයින් විසින් විස්තර කර ඇති මාගධී ප්‍රාකෘතයට වඩා පැරණි බව උගතුන්ගේ පිළිග

ැනීම යි. ඒ අනුව බෞද්ධ ත්‍රිපිටක පාලිය ද අශෝක ලිපිවල ප්‍රාකෘතය ද ක්‍රි.පූ. 600 පමණ සිට ක්‍රි.පූ. 200 පමණ දක්වා පැවති මධ්‍ය ඉන්දු ආර්ය භාෂා යුගයේ පළමු වැනි ප්‍රාකෘත සමයට අයත් කරනු ලබන අතර මාගධී ප්‍රාකෘතය ක්‍රි.ව. 200 පමණේ සිට ක්‍රි.ව. 600 පමණ දක්වා පැවති දෙවැනි සමයට අයත් කොට දක්වනු ලැබේ. (**Taraporawala, 1962: 3; S.K. Chatterji, 1972: Intro**). මේ කාරණා සනාථකර ගැනීම සඳහා ලෞකික සංස්කෘතයේ නැති එහෙත් පාලි හෝ වෛදික භාෂාවේ දක්නට ලැබෙන සමානකම් රාශියක් ම පාලියේ පෞරාණිකත්වය සඳහා සාධක වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

නිකාය භේදයත් සමග බුදුසමය ව්‍යාප්ත වීමේ දී එතෙක් වාචොද්ගතව පවත්වාගෙන ආ බුද්ධ වචනයෙහි භාෂා මාධ්‍යය ඒ ඒ ප්‍රදේශයන්ට අනුකූලව වෙනස් වන්නට ඇතැයි සිතිය හැකිය. ෆ්‍රැන්ක්ලින් එඩ්ගාර්ටන් මහතා (**Buddhist Hybrid Sanskrit Grammar and Dictionary II, 1953: Intro**). පෙන්වා දෙන පරිදි බෞද්ධ ග්‍රන්ථ යටත් පිරිසෙයින් පැරණි භාරතීය භාෂා හතරකින් පමණවත් දැනට ඉතිරිව දක්නට ඇති බව ප්‍රකාශ කරයි. ඒ අතුරින් පැරණිම භාෂාව පාලිය බවත් දැනට සොයාගෙන ඇති ඛරෝෂ්ඨී අක්ෂරයෙන් ලිඛිත **ධම්මපදය** රචනාකර ඇති ප්‍රාකෘතය ඊළඟට පැරණි භාෂාවක් ලෙසත් දක්වයි. උත්තර භාරතීය බෞද්ධ ග්‍රන්ථ ලියැවී ඇත්තේ මිශ්‍ර සංස්කෘත භාෂාවකින් බව පවසන එතුමා එය ප්‍රභව වී ඇත්තේ නියම වශයෙන් හඳුනාගත නොහැකි මධ්‍ය ඉන්දු ආර්ය භාෂාවකින් යැයි ද අදහස් කරයි. ක්‍රිස්තු වර්ෂයෙන් දෙවැනි ශත වර්ෂයට අයත් වන අශ්වඝෝෂ, නාගාර්ජුන ආදි ආචාර්යවරුන්ගේ කෘති ලියැවී ඇත්තේ සම්මත සංස්කෘතයෙනි. සිව්වන ධර්ම සංගායනාව පැවැත් වූ කණිෂ්ක සමයෙන් පසුව සංස්කෘතයෙන් ලියැවුණු **සර්වාස්තිවාදීන්ගේ ත්‍රිපිටකය** හා **විභාෂාවන්** ද උත්තර භාරතයේත් මධ්‍ය ආසියාවේත් බහුල වශයෙන් ව්‍යාප්තව යන්නට ඇතැයි සිතිය හැකිය. නාගාර්ජුන, අසංග, වසුබන්ධු ආදි ආචාර්යවරුන්ගේ කෘතීන් ද මහත් සේ සම්මානයට පාත්‍ර වූ අතර ඒ සියල්ලත් රචනා වී ඇත්තේ සම්මත සංස්කෘත භාෂාව මාධ්‍යය කොටගනිමිනි. මේ අයුරින් උත්තර භාරතය තුළ බුද්ධවචනයේ භාෂා මාධ්‍යය සංස්කෘතයට පරිවර්තනය වී දාර්ශනික වූත් ආචාර විද්‍යාත්මක වූත් විශේෂයෙන් ජනකාන්ත වූත් අංගයන්ගෙන් පෝෂණය වෙද්දී ථේරවාදි භික්ෂූහු බුද්ධවචනය පාලි භාෂාවෙන් ම

පවත්වා ගැනීමට උත්සාහ ගත්හ. මේ අනුව මධ්‍ය ඉන්දු ආර්ය භාෂා ගණයට අයත් උපභාෂාවක් වශයෙන් සම්භාවිතව පාලිය ත්‍රිපිටකය සංගෘහිත භාෂාව වශයෙන් විද්වතුන්ගේ සම්භාවනාවට පාත්‍ර වී ඇත. (The dialect of Middle Indo Aryan which is found in the text of the Theravadin Buddhists and usually called Pali by European scholars is how here so called in the Theravadin canon' **Norman, K.R., 1983: 1**)

**අට්ඨකථාවල** දී පාලි හෙවත් මාගධී භාෂාව ලෝකයේ මූල භාෂාව ලෙසත් බුද්ධාදී උත්තමයන් ව්‍යවහාර කරන භාෂාව ලෙසත් හැඳින්වීමට පටන් ගැණින. නිරුත්තිපටිසම්භිදාව විස්තර කරන **සද්ධම්මප්පකාසිනිය** මේ මතය ගෙනහැර දක්වමින් මෙවැනි ප්‍රකාශයක් ඉදිරිපත් කරයි.

අශ්‍රැතලාපී දරුවා ධර්මතා වශයෙන් මාගධී භාෂාව වචනයට නගා කථා කරයි. නිරය, තිරිසන් යෝනිය, පෙත්තිවිසය, මිනිස් ලොව, දෙව්ලොව යන සියලු තන්හි බහුල ව්‍යවහාරය මාගධියයි. අනාර්ය භාෂාවෝ වෙනස් වෙති. එහෙත් බ්‍රහ්ම වෝහාර, අරියවෝහාර නම් ලද මාගධිය වෙනස් නොවේ. බුදුරජාණන් වහන්සේ තෙවළා බුදුවදන් මාගධී භාෂාවට නගාලූයේ ද ඒ නිසා බව මෙහි දැක් වේ. (මාතා දමිළී පිතා අන්‍ධකො, තෙසං ජාතො දාරකො සචෙ මාතුකථං පඨමං සුණාති දමිළභාසං භාසිස්සති. සචෙ පිතුකථං පඨමං සුණාති අන්‍ධකභාසං භාසිස්සති. උභින්නම්පි පන කථං අසුණන්තො මාගධභාසං භාසිස්සති. යොපි අගාමකෙ මහාරඤ්ඤෙ නිබ්බත්තො, තත්‍ථ අඤ්ඤො කථෙන්තො නාම නත්‍ථි. සොපි අත්තනො ධම්මතාය වචනං සමුට්ඨාපෙන්තො මාගධභාසමෙව භාසිස්සති. නිරයෙ තිරච්ඡානයොනියං පෙත්තිවිසයෙ මනුස්සලොකෙ දෙවලොකෙති සබ්බත්‍ථ මාගධභාසාව උස්සන්නා. තත්‍ථ සෙසා ඔට්ඨකිරාතඅන්‍ධකයොනකදමිළභාසාදිකා අට්ඨාරසභාසා පරිවත්තන්ති. අයමෙවෙකා යථාභුච්චබ්‍රහ්මවොහාර අරියවොහාරසංඛාතා මාගධභාසා න පරිවත්තන්ති. සම්මාසම්බුද්ධොපි තෙපිටකං බුද්ධවචනං තන්තිං ආරොපෙන්තො මාගධභාසාය එව ආරොපෙසි. **පටිසම්භිදාමග්ගට්ඨකථා,** 4) බුද්ධ වචනයෙහි ආශ්චර්ය සහගත බව විදහා දක්වන මෙවැනි වෙනත් ප්‍රකාශන ද අට්ඨකථා තුළින් දැකිය හැකිය.

**සුමංගලවිලාසිනියෙහි** දැක්වෙනුයේ බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්මය අසන්නාගේ කණට වැටෙනුයේ ස්වකීය

භාෂානුරූපීව බව දැක්වේ. (නානානය නිපුණමනෙකජ්ඣාසයසමුට්ඨානං අත්ථබ්‍යඤ්ජන සම්පන්නං විවිධපාටිහාරියං ධම්මත්ථදේසනා පටිවෙධග ම්භීරං සබ්බසත්තානං සකසක භාසානුරූපතො සොතපථමාගච්ඡන්තං තස්ස භගවතෝ වචනං, **සුමංගලවිලාසිනී**, 21) භාෂාව හා බුද්ධවචනය දේවත්වයට නැගුණු මේ අදහස් දෙක ම තවදුරටත් සංවර්ධනය වී මූල භාෂා සංකල්පය සමගින් ව්‍යාප්ත වූ ආකාරය බුද්ධප්පියාචාර්යයන්ගේ **රූපසිද්ධියෙන් ද  සද්ධම්මසංගහයෙන් ද** දැකගත හැකිය. (සා මාගධී මූලභාසා නරායායාදිකප්පිකා, බ්‍රහ්මානො චස්සුතාලාපා සම්බුද්ධාචාපි භාසරෙ, රූපසිද්ධි, 1964: 38) **රූපසිද්ධියෙහි** එන මෙම මූලභාෂා මතයට විවරණ ඉදිරිපත් කරන **සන්දේහවිඝාතනී** සන්නය සියලු සත්වයන්ට මූලභූත භාෂාව මාගධික භාෂාව බව සඳහන් කරමින් මෙබඳු විවරණයක් ඉදිරිපත් කරයි.

'මූලභූත භාසා මූලභාසා, මෙයින් මූල භාෂාවගේ අන්‍ය භාෂාවන්ට ආදි භාවය ද ඒ භාවයන්ගේ ධාතු ප්‍රත්‍යයාදි විභාග කල්පයෙන් සංසක්ත භාවය ද පදාන්තයෙහි ස්වර නියම භාවයෙන් ව්‍යංඤ්ජන ශබ්ද භාවය ද කියන ලදැයි දතයුතු' (**සන්දේහවිඝාතනී නම් වූ සන්නය, 1934:146**)

එහෙත් මගධ භාෂාව ම ලෝකවාසීන්ගේ මූල භාෂාව විය හැකි දැයි පැනයක් මතුවිය හැකිය. එසේ ම එබඳු පැනයක් මතුවීම ද සාධාරණ ය. මාගධ යනු එක් ප්‍රදේශයකට පමණක් අයත් දේශීය භාෂාවක් ම වූ බැවින් එය සියලු දෙනාට සාධාරණ මූල භාෂාවක් වනුයේ කෙසේ දැයි විමසිය යුතු කරුණකි. බුද්ධඝෝෂාචාරීන් 'දෙසභාසා නාම එකසතවොහාර කුසලතා' යන්නෙන් දඹදිව සියයකට වඩා භාෂා තිබුණු බව දැක්වූයෙන් මගධ භාෂාව ද එයින් එක් භාෂාවක් පමණක් යැයි සිතීම සාධාරණ ය. මාගධිය ආදිම භාෂාවක් වශයෙන් සැලකීමට සාධාරණ හේතු බද්දේගම විමලවංස හිමියන් මෙසේ දක්වා ඇත. 'පාලි භාෂාව සකුවට වඩා පැරණි යැයි සිතූ ආචාර්යයෝ ඒ මතය අතිශයෝක්තියකට නගමින් ලෝකයේ ආදිතම භාෂාව පාලිය (මාගධිය) යි කියූහ. ආදිම භාෂාව කුමක් දැයි තව ම සොයාගෙන නැතැයි කීම සත්‍යයට වඩා සමීප වනු ඇත. එහෙත් පාලිය අර්ධ මාගධි ආදී ප්‍රාකෘත භාෂාවලට වඩා පැරණි ය. වේද භාෂාවත් පාලියත් මුල් ම ප්‍රාකෘත භාෂාවක අතුදෙකකි' (**විමලවංස හිමි, බද්දේගම, 1950: 7**) යනුවෙනි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසු ආසන්න කාලයක දී ම බුදුන්වහන්සේත් උන්වහන්සේ සම්බන්ධ කොට දැක්විය හැකි සියල්ලක්ම දේවත්වයට නගා ආශ්චර්ය අද්භූත ස්වභාවයකින් ඉදිරිපත් කිරීම ආරම්භ වූයේ යැයි සිතිය හැකිය. අන්‍ය නිකායික හා අන්‍ය ආගමික බලපෑම් මත පදනම්ව එහි සංවර්ධිත අවස්ථාවක් පාලි අට්ඨකථා සාහිත්‍යය තුළින් ද පිළිබිඹු වේ. භාෂාව පිළිබඳ මතය ද එවැනි පසුබිමක් මත සංවර්ධනීය තත්වයකට පත්වන්නට ඇතැයි සැලකීම අනුචිත නොවේ. ඒ අනුව මූල භාෂා සංකල්පය වාග්විද්‍යානුකූලව හෝ ඓතිහාසික වශයෙන් හෝ විමර්ශනයට භාජනය කිරීම නිරර්ථක උත්සාහයක් ලෙස සැලකිය හැකි නමුත් මෙම මතාන්තරයන් පැන නැඟීමට තුඩුදුන් හේතූන් සලකා බැලීම මෙහි දී ප්‍රයෝජනවත් වෙයි.

පාලි භාෂාවට ආශ්චර්යමත් ස්වභාවයක් ආරෝපණය කිරීම අට්ඨකථාචාර්යයන්ගේ කාර්යයක් සේ සැලකිය හැකිය. නිකායසංග්‍රහයෙහි සඳහන් පහත දැක්වෙන පාඨය අනුව සැලකීමේ දී මෙවැනි පසුබිමක් සඳහා ඔවුන් මෙහෙයවන ලද්දේ සමකාලීන ශාසනික තත්ත්වය විසින් බව පැහැදිලි වේ.

"මෙසේ ධර්මරුචි නම් නිකායෙන් බුදුන් පිරිනිවි සාරසිය සිව්පණස් අවුරුද්දක් ගිය පසු වළගම්අබා නම් මහරජහු දවස් ඔහුට පසළොස් වන්නෙහි ථේරිය නිකායෙන් භින්නව හගිරි වෙහෙර ව්‍යාප්ත වී." (**නිකායසංග්‍රහය, 1984: 12**)

ඉන්දියාවේ පැවති වජ්ජිපුත්තක නිකායට අයත් භික්ෂුවකගේ ප්‍රධානත්වයෙන් මහාවිහාරයෙන් බිඳීගොස් ආරම්භ වූ අභයගිරි සඟ පරපුර ක්‍රමයෙන් විශාලවත්ම ජනප්‍රසාදය ද වැඩිවන්නට විය. ගිහි ජනයාගේ ප්‍රසාදය වැඩිකර ගැනීමෙහි සමත් වූ ආචාර සමාචාරයන්ගෙන් පරිපූර්ණ වූ හෙයින් ටික කලකින් ම සැලකිය යුතු බලවත් පිරිසක් බවට පත්වීමට අභයගිරි නිකායිකයන්ට හැකි විය.

මහාවිහාරිකයන් අනුගමනය කළ වත්පිළිවෙත් ආදිය මෙන්ම බුද්ධ වචනය පැවැති පාලි භාෂා මාධ්‍යය ද පිළිගැනීමට අභයගිරිකයෝ කැමැති නො වූහ. මහාවිහාරිකයෝ ද ථේරවාදී නිර්මල බුද්ධධර්මයේ නිරවද්‍යතාවත් පෞරාණිකත්වයත් ස්ඵුට කර දැක්වීම සඳහා මූලභාෂා මතය ඉදිරිපත් කළහ. පාලි භාෂාවට අතිශ්‍රේෂ්ඨ

තත්ත්වයක් ආරෝපණය කිරීමට සිදුවූයේ ඒ පදනම නිසාය. මෙම මතය ම තවදුරටත් සනාථ කිරීම සඳහා වල්පොල රාහුල හිමියන් පවසන්නේ පාලි භාෂාව පළමුවෙන් සොයාගත් දේශය ශ්‍රී ලංකාව බව යි. අනතුරුව වෙනත් ථෙරවාදී රටවලට පාලි භාෂාව එහි **ත්‍රිපිටකයත් අට්ඨකථාත්** සමඟ ව්‍යාප්ත කොට ඇත. එහෙත් පාලියෙහි ප්‍රභවය ලංකාවෙන් (සීහළදීප) සිදු වූ බව කිසිවෙක් නොපිළිගන්නා බවත් උන්වහන්සේ ම සඳහන් කරති. (**Rahula, Walpola, 1997: 9**)

භාරතීය භාෂා ඉතිහාසයේ පාලියේ පසුබිම යුග තුනකට වර්ග කරමින් සංවර්ධනය වූවක් බැව් පර්යේෂකයන්ගේ පෙන්වාදීමයි. එනම්, (**පාලි සාහිත්‍ය ඉතිහාසය,** 08)

1. පුරාතන භාරතීය ආර්ය භාෂා යුගය (වෛදික යුගයේ සිට ක්‍රි.පූ. 500 දක්වා)

2. මධ්‍යකාලීන ආර්ය භාෂා යුගය (ක්‍රි.පූ. 500 සිට ක්‍රි.ව. 1000 දක්වා)

3. ආධුනික භාරතීය ආර්ය භාෂා යුගය (ක්‍රි.ව. 1000 සිට වර්තමානය දක්වා)

පළමු භාෂා යුගයේ ලක්ෂණ ඍග්වේද ග්‍රන්ථතුළින් දැක් වේ. මධ්‍යකාලීන අවදියේ දී වේද භාෂාවේ විවිධත්වයක් දැක් වේ. මේ විවිධමය වූ භාෂා ලක්ෂණ ප්‍රාන්ත ඇසුරෙන් වෙනම විකාශය වීමකි. භාග්‍යවතුන් වහන්සේ ද මගධ ප්‍රාන්තයේ වාසය කරමින් එම ප්‍රාන්ත ජනයාගේ භාෂාවෙන් ස්වකීය දේශනාව සිදුකළහ. මේ නිසා මේ අවදිය තුළ විවිධ භාෂා, ප්‍රාන්තීය භාෂා හා උපභාෂාවල සම්මිශ්‍රණයකි. මෙම මධ්‍යකාලීන ආර්ය භාෂා යුගය ස්තර තුනක් ඔස්සේ විකාශය වූ අයුරු ද දැක් වේ. (**පාලි සාහිත්‍ය ඉතිහාසය,** 08)

1. පාලි හා අශෝකගේ ධර්මලිපි භාෂාව (ක්‍රි.පූ. 500 - ක්‍රි.ව. 1 දක්වා)

2. ප්‍රාකෘත භාෂාව (ක්‍රි.ව. 1 - ක්‍රි.ව. 500 දක්වා)

3. අපභ්‍රංශ භාෂාව (ක්‍රි.ව. 500 - ක්‍රි.ව. 1000 දක්වා)

මෙම අපභ්‍රංශ භාෂාවලින් හින්දි, මරාටි, ගුජරාටි ආදි වර්තමාන ප්‍රාන්තීය භාෂාවන්ගේ විකාසය දැක් වේ. පාලිය ද ප්‍රාකෘත භාෂා පවුලෙන් පැවත එන්නෙකි. පාලියෙහි මූල භාෂා සංකල්පයේ දී මෙය කිනම් ප්‍රාන්තීය භාෂා මාධ්‍යයක් ද යන්න පිළිබඳ වත්මන් පෙරා'පර දෙදිග විද්වතුන්ගේ විමර්ශනයට ලක් වූ කරුණකි. (**Rhys davids, T.W., 1903:153-4; Pali English Dictionary, V; Geiger, W.,1943: 3-4; Franke, R.O., 1902: 127&" Grierson, G., Bhandarkar: 117" Winternitz, M., 1933: 13**) පාලි භාෂා විකාශයේ ස්වරූපය අධ්‍යයනය කළ ගයිගර් එහි අවස්ථා හතරක් පෙන්වා දෙයි. (**Gaiger, W., 2-3**)

**1. ත්‍රිපිටකයේ ගාථා භාෂාව**

මෙම භාෂා තත්වය ඉතා පෞරාණික වන අතර වෛදික භාෂාවෙහි මෙන් අනේක රූපී බවක් මෙහි දැකිය හැකිය. මේ තුළ පැරණි වෛදික භාෂාවෙන් ඇති කරගත් ධ්වනි පරිවර්තන නිසා ඇති වූ වෙනස්කම් ද පාලියට අයත් විශේෂ පෞරාණික විධාන ද දක්නට ලැබේ. මෙම භාෂා තත්වය විශද කරන භාෂා ශෛලිය සුත්ත නිපාතයෙන් පිළිබිඹු වේ.

**2. ත්‍රිපිටකයේ ගද්‍ය කොටස්වල භාෂාව**

ගාථා භාෂාවට වඩා ගද්‍ය කොටස් තුළ එක්රූපී බවක් දැකිය හැකිය. ගාථා භාෂාවට වඩා පෞරාණික භාෂා ලක්ෂණයන්හි ඌනතාවක් ද නව භාෂා ලක්ෂණයන්හි අභිවෘද්ධියත් මේ තුළින් විද්‍යමාන අතර ජාතක භාෂාව මෙම අවස්ථාව නිරූපණය කරන්නෙකි.

**3. පශ්චාත් කාලීන පාලි ගද්‍ය සාහිත්‍යය**

මෙම අවස්ථාවෙහි භාෂා ලක්ෂණ **මිලින්දපඤ්හයෙනුත්** අට්ඨකථා සාහිත්‍යයෙනුත් දැකිය හැකිය. විශේෂයෙන් මේ තුළ අලංකාරමය ස්වභාවයත් කෘත්‍රිම බවත් ඇතුළත් වේ. එසේ ම **මිලින්දපඤ්හයෙනුත් අට්ඨකථාවන්හිත්** පාලියෙහි විකසිත වූ උදාර ගද්‍ය ශෛලියක් විද්‍යමාන ය.

## 4. පශ්චාත් කාලීන පාලි කාව්‍ය භාෂාව

මෙම අවස්ථාවෙහි ඇත්තේ පූර්ව සාහිත්‍ය කෘතීන් අනුකරණය කළ භාෂා ලක්ෂණ ය. පැරණි ශබ්ද රූප රකිමින් නවීන ස්වරූප ද මෙහි අන්තර්ගත වේ. විශේෂයෙන් සංස්කෘතයෙහි ආභාසය මේ යුගයේ සාහිත්‍ය රචනාවන්ට ඇතුළත් වීම විශේෂ ලක්ෂණයකි. ඒ අනුව **දීපවංස, මහාවංස, දාඨාවංස** වැනි ග්‍රන්ථවලින් මෙම භාෂා ස්වරූප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය.

## පාළි භාෂාව පිළිබඳ වාග්විද්‍යාත්මක විග්‍රහය

ථෙරවාදී බෞද්ධ ඉගැන්වීම් හා තදනුබද්ධ සාහිත්‍යය ලේඛනගත කර ඇති ප්‍රධානතම භාෂාව පාළි නමින් මූලිකව හැඳින්විය හැකිය. එය ලෝක භාෂා පවුල් අතර ප්‍රධාන අංකයකට වැටෙන ඉන්දු-යුරෝපීය භාෂා පවුලෙහි වැදගත් ශාඛාවක් වන ආර්ය හෙවත් ඉන්දු-ඉරාණීය ශාඛාවේ ඉන්දීය කොටසට අයත් වන්නකි. (**ජයසේකර, ආනන්ද, 2000**: 154-157) ඉතිහාසයක් ඇති ඉන්දු-යුරෝපීය භාෂා පවුලෙන් පැවත එන ආර්ය භාෂා භාරතය තුළ පමණක් අවුරුදු 3500 කට නොඅඩු කාලයක් නොකඩවා වැඩෙමින් පවතින බව ආනන්ද ජයසේකර කියයි. (**එම.**, 188) ඉන්දියාව තුළ විකාශයට පත් ආර්ය භාෂා ඉන්දු-ආර්ය නමින් ද ඊට අයත් කාල පරිච්ඡේදය ඉන්දු ආර්ය භාෂා යුගය නමින් ද වෙසෙසා සලකනු ලබයි. ශබ්ද තත්ත්ව, රූප තත්ත්ව, වාක්‍යරීති, වාග්මාලාව හා අර්ථ විචාරය පිළිබඳව ඇති වෙනස්කම් සැලකිල්ලට ගෙන වාග්වේදීන් විසින් සම්පූර්ණ ඉන්දු ආර්ය භාෂා ඉතිහාසය ප්‍රධාන යුග තුනකට බෙදා තිබේ.

I. පුරාතන ඉන්දු ආර්ය යුගය (ක්‍රි.පූ. 1500 - ක්‍රි.පූ. 600)

II. මධ්‍යතන ඉන්දු ආර්ය යුගය (ක්‍රි.පූ. 600 - ක්‍රි.ව. 1000)

III. නූතන ඉන්දු ආර්ය යුගය (ක්‍රි.ව. 1000 සිට මේ දක්වා)

යනු එම යුග තුනයි. වරහන් තුළ දැක්වෙන්නේ ඒවාට අදාළ කාල පරාසයන්ය. අදින් බොහෝ ඈත අතීතයට දිවයන කාල පරිච්ඡේදයක් පිළිබඳ නිශ්චිත නිගමන ඉදිරිපත් කිරීමට කිසිවෙකු

සමත් නොවේ. එය ඉන්දු ආර්ය භාෂා පිළිබඳ යුග බෙදීමට ද සාධාරණය. පෙරා'පර දෙදිගම බොහෝ වාග් විද්‍යාඥයන් විසින් මෙම යුග බෙදීම අනුමත කර ඇතත් එක් එක් යුගයට අයත් කාල සීමාව පිළිබඳ ඒකමතිකත්වයකට එළඹීමට ඔවුන් මැලිවී ඇත්තේ එහෙයිනි. (**Woolner, A.C., 1928: 1; Ghatage, A.M., 1962; Taraporawala, I.J.S., 1951: 241; Sukumar Sen, 1960; Chatterji, S.K., 1938: Introduction**) මෙහි මධ්‍යතන යුගය තුළ භාෂා විකාශයේ අවස්ථා තුනක් දක්නට ලැබෙන බැවින් නැවතත් එය කොටස් තුනකට බෙදා වෙන්කර තිබේ.

1. ප්‍රථම ප්‍රාකෘත අවධිය (ක්‍රි. පූ. 600 - ක්‍රි.ව. 200)
2. ද්විතීය ප්‍රාකෘත අවධිය (ක්‍රි.ව. 200 - ක්‍රි.ව. 500)
3. තෘතීය ප්‍රාකෘත අවධිය (ක්‍රි.ව. 600 - ක්‍රි.ව. 1000) (**හෙට්ටිආරච්චි, ඩී. ඊ., ප්‍රාකෘත සංග්‍රහය, 1947: 2-3; හෙට්ටිආරච්චි, ඩී.ඊ., ධම්පියා අටුවා ගැටපදය, 1974, ප්‍රස්තාවනා**)

මෙයින් පළමුවැනි අවධියට අශෝක රජු විසින් කරවන ලද ශිලාලේඛනවල ඇති ප්‍රාකෘතය ද ථෙරවාදී ධර්මග්‍රන්ථ ලියැවී ඇති පාළි ප්‍රාකෘතය ද අයත් වේ. දෙවැනි අවධියට මහාරාෂ්ට්‍රී, ශෞරසේනී, මාගධි (ප්‍රාකෘතප්‍රකාශය වැනි ව්‍යාකරණ ග්‍රන්ථවල සඳහන් මාගධිය) ආදි ප්‍රාකෘත විශේෂ ද ජෛන ධර්මග්‍රන්ථ ලියැවී ඇති අර්ධ මාගධිය ද අයත් වේ. තෙවැනි අවධියට අයත් වන්නේ අපභ්‍රංශ භාෂාවයි. එහෙයින්ම මෙම කාලය අපභ්‍රංශ යුගය ලෙස ද හැඳින්වෙයි. (**ජයසේකර, 244**) මෙම බෙදීම අනුව පැහැදිලි වන්නේ පාලිය මධ්‍යතන ඉන්දු ආර්ය භාෂා යුගයේ පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවයි.

පුරාතන ඉන්දු ආර්ය යුගයෙන් පසු ඉන්දීය ආර්ය භාෂාවන්ගේ පරිණාමයේ අනතුරු අවස්ථාව පාලි භාෂාවෙන් දැකගත හැකිය. ඒ අනුව වෛදික භාෂාවෙන් පසු යුගයට අයත් භාෂා ලක්ෂණ පාලියෙහි විද්‍යමාන වෙයි. නූතන ඉන්දු ආර්ය භාෂා සියල්ල එකට එකතු කරන ආදිතම මූලයක් වන වෛදික භාෂාවේ ඇති සුවිශේෂිතාව නම් එහි ඇති බහුරූපතාවයි. මෙම බහුරූපතාවේ උත්තරාධිකාරය

සංස්කෘතයට වඩා පාලියට ලැබී ඇති බව ඒ පිළිබඳ පර්යේෂණ කළ උගතුන් විසින් පිළිගෙන තිබේ. (**Katre, S.M., 1964:41; Sukumar Sen, 34**; භරතසිංහ උපාධ්‍යාය, 2003:21)

ඒ සඳහා පහත දැක්වෙන නිදර්ශන ඉදිරිපත් කළ හැකිය. (පහතින් පෙළගස්වා ඇති භාෂා ප්‍රයෝග වෛදික භාෂාවේ සුලභ වුව ද සංස්කෘතයේ දක්නට නැති තරම්ය. එහෙත් පාලි භාෂාව තුළ ඒවා ආරක්ෂා වී තිබේ. මෙහි දැක්වෙන කරුණු සඳහා විල්හෙල්ම් ගෛගර්, සුකුමාර් සෙන්, ඒ. එම්. සාට්ගේ, සුනිතිකුමාර් චැටර්ජි, භරතසිංහ උපාධ්‍යාය, එස්. එම්. කත්‍රෙ, ඩී.ඊ.හෙට්ටිආරච්චි, වී. පර්නියෝලා වැනි උගතුන් විසින් කරන ලද පර්යේෂණ ඉතා සමීපයෙන් ආශ්‍රය කෙරිණ.)

1. අකාරාන්ත ශබ්දවල තෘතීයා විභක්ති බහුවචනය සඳහා වෛදික භාෂාවේ දී එභිඃ ප්‍රත්‍යයාන්ත දෙවෙභිඃ, කර්ණෙභිඃ වැනි රූප අතහැර දමා ඒ වෙනුවට ඓඃ ප්‍රත්‍යයාන්ත දෙවෛඃ, කර්ණෛඃ වැනි රූප නිර්මාණයකර තිබේ. එසේ වුවත් දෙවෙහි, කණ්ණෙහි ආදී වශයෙන් විසර්ගය ලොප් වූ රූපවලින් වෛදික භාෂාවේ ඇති ඓඃ ප්‍රත්‍යයාන්ත රූප පාලි භාෂාව තුළ ආරක්ෂා වී ඇත.

2. වෛදික භාෂාවේ විශ්වන්, ච්‍යවන් වැනි නපුංසක ලිංග ශබ්දවල ප්‍රථමා, සම්බෝධන හා ද්විතීයා විභක්ති බහුවචන රූප ආකාරාන්තව දක්නට ලැබේ. (ඉමා විශ්වා, ච්‍යවනා කෘතානි) මෙය පාලියේ දී චිත්තා, රූපා ආදී වශයෙන් දැකගත හැකිය. එහෙත් සංස්කෘතය මේ ආකාරාන්ත නපුංසක ලිංග රූපය අතහැර දමා තිබේ.

3. අකාරාන්ත පුරුෂ ලිංග ශබ්දවල බහුවචන රූපය සඳහා වෛදික භාෂාවෙහි අසුක් යන ප්‍රත්‍යය භාවිත වී ඇති අතර බ්‍රාහ්මණාසඃ, දෙවාසඃ, අශ්වාසඃ, ප්‍රියාසඃ වැනි ශබ්දරූප ඊට නිදසුන්ය. මෙම ශබ්ද රූපය සංස්කෘතය විසින් අතහැර ඇතත් දෙවාසෙ, ධම්මාසෙ, බුද්ධාසෙ යන පාලි ශබ්දරූපවල දී එම ප්‍රත්‍ය රූපයේ ශේෂයන් දැකගත හැකිය.

4. තෘතීයා විභක්ති ඒකවචනය සඳහා ආකාරාන්ත ශබ්ද රූප වෛදික භාෂාවේ යෙදී ඇති බව 'ශර්වා ජසාන්' යන නිදසුනෙන් පැහැදිලි වේ. මෙවන් ශබ්ද රූප සංස්කෘතයේ නොමැත. එහෙත්

'සහත්‍ථා' (සන්තප්පෙත්‍වා) වැනි පාළි ප්‍රයෝගවල දී දැකගත හැකිය.

5. වෛදික භාෂාවේ කර්තෘ කාරක පරස්මෛපද උත්තමපුරුෂ බහුවචනයේ යෙදුණු මසි යන ප්‍රත්‍යය සංස්කෘතයෙන් ගිලිහී ගොස් ඇතත් යමාමසෙ, (ධම්මපද) චරාමසෙ (සුත්තනිපාත) වදාමසෙ, ලභාමසෙ (ථෙරගාථා) යන පාලි ක්‍රියාරූප තුළ එම ප්‍රත්‍යය සුරක්ෂිත වී තිබේ.

6. මේ ආකාරයෙන්ම ප්‍රථම පුරුෂ බහුවචනය සඳහා වෛදික භාෂාවේ යෙදුණු 'රෙ' ප්‍රත්‍යය ද (මිත්‍රාය පඤ්ච යෙමිරෙ - පච්චරෙ, භාසරෙ පිපීයරෙ (සුත්තනිපාත) වැනි පාලි ක්‍රියාරූප තුළ දක්නට ලැබේ.

7. සෙ, සෙන, අසෙ, අසෙන, කසෙ, කසෙන, අධෛය, අධෛයන, කධෛය, කධෛයන, තවෙ, තවෙන තායෙ තුං ආදි බොහෝ නිමිත්තාර්ථක ප්‍රත්‍ය වෛදික භාෂාවෙහි යෙදී තිබේ. මේ බොහෝ ප්‍රත්‍ය අතරින් තුං ප්‍රත්‍යය පමණක් සංස්කෘතය විසින් රැගෙන තිබේ. පාලිය විසින් ඒ සමඟ තවෙ, තායෙ යන ප්‍රත්‍ය ද ගෙන තිබේ. ඒ අනුව දාතවෙ, කාතවෙ, සොතවෙ, දක්ඛිතායෙ, පුච්ජිතායෙ, ඛාදිතායෙ වැනි තුමර්ථ ක්‍රියාරූප පාලියෙහි විද්‍යමාන වේ.

8. පූර්වක්‍රියා අර්ථය සඳහා වෛදික භාෂාවේ යෙදී ඇති ත්‍වා, ත්‍වාය, ත්වීන ආදි ප්‍රත්‍යවලින් ත්‍වා ප්‍රත්‍යය පමණක් සංස්කෘතය විසින් රැගෙන ඇතත් පාලිය ඊට අමතරව ත්‍වාන හා තූන වශයෙන් ඉතිරි ප්‍රත්‍ය දෙකෙහි සබඳතා සහිත ප්‍රත්‍ය දෙකක් ද ඉදිරිපත් කර තිබේ. කත්‍වාන, කාතූන ආදි රූපවල දී ඒවා දැකගත හැකිය.

9. ළ, ළ්හ යන අක්ෂර දෙකම පාලි භාෂාව තුළ දක්නට ඇති නමුත් සම්භාව්‍ය (ලෞකික) සංස්කෘතයේ නැත. ඒවා පාලියට පැමිණ ඇත්තේ වෛදික භාෂාවෙනි. වෛදික සංස්කෘතයෙහි මෙම අක්ෂර දෙකම විද්‍යමාන වූ බවට සාධක **ඍග්වේදයෙන්** සොයාගත හැකිය. විශේෂයෙන්ම ඍග්වේදයෙහි ස්වර මධ්‍යගතව පිහිටා ඇති ඩ කාරය ළ ලෙසත් ඪ කාරය ළ්හ ලෙසත් උච්චාරණය වූ බව වාග්වේදීන්ගේ මතයයි. (**Geiger, W., 1957: 61**) 'අග්නිමීළේ පුරොහිතම්' යන ඍග්වේද මන්ත්‍රයෙහි ඊළෙ යන්න √ඊඩ් (ස්තුතෞ) ධාතුවෙන් නිර්මිත

ලට් ලකාරයෙහි ආත්මනේ පද උත්තම පුරුෂ ඒකවචන ක්‍රියා පදයකි. එහි ලේඛන රූපය ඊඩේ විය යුතු වුවද ඩ් කාරය ස්වර දෙකක් මැද (ඊ + ඩ් + එ) පිහිටා ඇති නිසා ළ ලෙස උච්චාරණය වේ. 'ඊඩෙයා නූත නෛරුත' යන තැන ඊඩෙයා යන්න ඊඩ් ධාතුවෙන්ම නිපන් ක්‍රියාවක් වුවත් එහි ළ කාරය දක්නට නැත්තේ ඩ් කාරය ස්වර මැද පිහිටා නොමැති නිසාය. (ඊ+ඩ්+ය) එය පිහිටා ඇත්තේ ස්වරයක් හා ව්‍යඤ්ජනයක් අතර මැදය. ඪ කාරයේ ස්වරූපයත් මෙබඳුමය. 'තම ආසීත් තමසා ගුළ්හමග්‍රෙ' යන පාඨයෙහි ගුළ්හං යනු ගූඪං යන පදයේ උච්චාරණ ස්වරූපයයි. එහි ඪ කාරය ස්වර මධ්‍යගතව (ග් + ඌ + ඪ් + අ) පිහිටා ඇති නිසා ළ්හ බවට පත්ව තිබේ. මේ ළ්හ යනු ළ කාරයේ මහාප්‍රාණ ස්වරූපය සේ Macdonell හඳුනාගෙන තිබේ. (**Macdonell, A., 1953: 3**) පාලිය තුළ ද මෙම අක්ෂර දෙකම භාවිත වී ඇති බව තළාක, දළ්හ, මූළ්හ වැනි නිදසුන්වලින් පැහැදිලි වේ.

10. වර්තමාන කාලික උත්තම පුරුෂ ක්‍රියාපද උකාරාන්තව යෙදීම වෛදික භාෂා ලක්ෂණයකි. මෙම ලක්ෂණය ද පාලියෙහි දක්නට ලැබේ. විහරෙමු (තයජ්ජ ගුත්තා විහරෙමු) නමස්සෙමු (යත්ථ ගන්ත්වා නමස්සෙමු) ජානෙමු (අජානතං නො පබ්‍රෑහි යථා ජානෙමු තං මයං) ආදිය ඊට උදාහරණයි.

පාලි නමින් හැඳින්වෙන මේ ආගමික ශාස්ත්‍රීය භාෂාවේත් ඉන්දියාවේ පැරණිතම ශිලාලේඛන ලියා ඇති භාෂා විශේෂයන්ගේත් සම්මිශ්‍රණයෙන් ඒ ඒ ප්‍රදේශයන්හි උද්ගත වූ මූල ප්‍රාකෘත රාශියක සටහන් ද දැකගත හැකිය. එම මූල ප්‍රාකෘත පිළිබඳ ස්වල්ප වූ හෝ අවබෝධයක් ඇති කරගැනීමට හැකිවන්නේ දැනට ඉතිරිව ඇති මධ්‍ය ඉන්දු ආර්ය භාෂා යුගයට අයත් ලේඛන තුළිනි.

වෛදික භාෂාව හා ඍජුවම සම්බන්ධ නොවන පදසාධක ප්‍රත්‍ය රාශියක් මධ්‍ය ඉන්දු ආර්ය භාෂාවන්හි පෙනෙන්නට තිබේ. ධෞලියෙහි ඇති අශෝක ශිලාලේඛනයේ ඇති පූර්ව ක්‍රියා සාධක 'තු' ප්‍රත්‍යය මේ සඳහා හොඳම නිදසුනකි. පාලියේ ද මෙම පූර්ව ක්‍රියා ප්‍රත්‍යය සහිත රූප විද්‍යමානය. සුත්තනිපාතයේ දක්නට ලැබෙන දට්ඨු යන පූර්වක්‍රියාව ඊට නිදසුනකි. එහෙත් වෛදික භාෂාවේ එවන් ප්‍රත්‍යයක් යෙදී නොමැත. මෙයින් පැහැදිලි වන්නේ මධ්‍ය ඉන්දු ආර්ය භාෂාවන්හි ඊට ආවේණික වූ දේශීය ලක්ෂණ ද දක්නට ලැබෙන බවයි.

පාළි යනු ප්‍රාකෘත භාෂා යුගය ලෙස හැඳින්වෙන මධ්‍ය ඉන්දු ආර්ය යුගයේ පූර්ව අවධියට අයත් භාෂාවක් බව ඉහත දී පැහැදිලි කෙරිණ. අශෝක ශිලාලේඛනවල භාෂාව ද මේ කාලයටම අයත් වේ. මෙම ශිලාලේඛනවලින් එවකට භාරතයේ (ප්‍රචලිතව) පැවති මධ්‍යතන ඉන්දු ආර්ය යුගයේ මුල් කාලයට අයත් උපභාෂා පිළිබඳ පැහැදිලි සටහන් හෙළි වෙයි. (**ජයසේකර**, 213)

පාළි යනු අශෝක කාලයේ තිබූ සාමාන්‍ය ව්‍යවහාර භාෂාවක් සේ හඳුනාගත හැකිය. එක් කරුණක් පැහැදිලි කිරීම සඳහා එකිනෙකට වෙනස් වූ ප්‍රාදේශීය භාෂාවන්ගෙන් ලියන ලද අශෝක ශිලාලේඛන (ෂබාස්ගර්, මාන්සේරා, ජෞගඩ, ගිර්නාර්, කාල්සි, ධෞලි) තුලනාත්මකව පරීක්‍ෂා කළ විද්වතුන් විසින් වෙන් වෙන් වූ භාෂා ලක්‍ෂණ සහිත විවිධ ව්‍යවහාර භාෂා පැවති බව පෙන්වා දී ඇත. (**Sukumar Sen; ජයසේකර**, 214-221; **Chatterji, S.K., 1963**)

අශෝක යුගයේ පැවති එම උපභාෂාවල විකාශය තුළින් ප්‍රාකෘත භාෂාවන්ගේ උද්ගමය ඇති වී තිබේ. (**උපාධ්‍යාය, භරතසිංහ, 2003**; 23) මාගධි සහ අර්ධ මාගධි අශෝක කාලීන නැගෙනහිර භාෂා විය. පළමුව මේවා කථා මාත්‍ර වූ අතර පසුව සාහිත්‍යය සඳහා ද යොදා ගැනිණ. අනතුරුව ඒවායේ විකාශය නැවතී තිබේ. භරත මුනි ඔහුගේ ශ්‍රේෂ්ඨ කෘතියක් වන නාට්‍ය ශාස්ත්‍රයේ ප්‍රාකෘත භාෂා සතක් ගැන සඳහන් කරයි. (මාගධ්‍යවන්තිකා ප්‍රාච්‍යා - ශූරසෙන්‍යර්ධමාගධි වාහ්ලීකා දාක්ෂිණාත්‍යාශ්ච - සප්තභාෂා ප්‍රකීර්තිතාඃ (1.34) **The Nyāyasastra, Vol. I, 1967**) එනම් 1. මාගධි, 2. ආවන්තී, 3. ප්‍රාච්‍යා, 4. ශෞරසේනී, 5. අර්ධමාගධි, 6. වාහ්ලීකා, 7. දාක්ෂිණාත්‍ය වශයෙනි.

පසුව ප්‍රාකෘත ව්‍යාකරණඥ හේමචන්ද්‍රයන් විසින් පෛශාචී හා ලාටී යන භාෂා දෙක ද එකතු කර තිබේ. (**Prakrit Grammar of Hemacandra, 1958; Introduction**) මේ සියලු ප්‍රාකෘත මූලික කොටස් හතරකට බෙදා දැක්වේ. එනම් මාගධී, ශෞරසේනී, අර්ධමාගධී හා මහාරාෂ්ට්‍රී යනුවෙනි. මෙයින් මහාරාෂ්ට්‍රී යනු ශෞරසේනී ප්‍රාකෘතයේම පසුකාලීන විකසිත ස්වරූපය වෙතැයි ඇතැම් පර්යේෂකයෝ සලකති. (**Chatterji, SK., 1938: 55-56**) ප්‍රාකෘත ව්‍යාකරණඥයින් විසින් ද මහාරාෂ්ට්‍රීයට වැඩි සැලකිල්ලක්

දක්වා තිබේ. කාව්‍යාදර්ශ කර්තෘ වූ දණ්ඩින් සඳහන් කරනුයේ මහාරාෂ්ට්‍රීය උසස්ම ප්‍රාකෘතය සේ සැලකෙන බවයි. (මහාරාෂ්ට්‍රාං ශ්‍රයාං භාෂාං - ප්‍රකෘෂ්ටං ප්‍රාකෘතං විදුඃ, **කාව්‍යාදර්ශය, 2001**) ප්‍රාකෘත ප්‍රකාශය රචනා කළ වරරුචි ස්වකීය කෘතියේ පරිච්ඡේද දොළසින් අටක්ම වැයකර ඇත්තේ මහාරාෂ්ට්‍රී ප්‍රාකෘතයේ විස්තර සඳහාය. භාෂා තත්ත්ව දෘෂ්ටියෙන් සලකාබැලීමේ දී පාළි හා ඊට පසුව විකාශය වූ ප්‍රාකෘත භාෂාවලත් නොයෙක් සමානතා පවතියි. ඒවා පොදුවේ මධ්‍ය ඉන්දු ආර්ය භාෂා ලක්ෂණ සේ වටහා ගත හැකිය.

## සමාලෝචනය

මුල් අවදියේ දී පාළි යන්න භාෂා අර්ථයෙන් නොයෙදුනු අතර එයින් පෙළ, පාඨය, බුද්ධවචනය යනාර්ථ උද්දීපනය වූ බව පැහැදිලිය. පාළිය භාෂා අර්ථයෙන් භාවිතයට පැමිණෙන්නේ ත්‍රිපිටක සහ අට්ඨකථා අවධියෙන් පසුවය. බුදුන් වහන්සේ දේශනා මාධ්‍යය වශයෙන් තෝරා ගනුයේ මාගධී භාෂාව හෙවත් මාගධී නිරුක්තිය වූ අතර එය එවකට පැවැති ප්‍රාකෘත භාෂා අතර එක් භාෂා ගණයකි. වෛදික සංස්කෘතයත් මාගධියත් අතර සමීපත්වයක් පැවැති අතර වෛදික භාෂා ලක්ෂණ මාගධී ප්‍රාකෘතය තුළ සුරක්ෂිතව පැවතුණි. එබැවින් ලෞකික සංස්කෘතයටත් වඩා මාගධී ප්‍රාකෘතය පෞරාණික භාෂා ලක්ෂණ දරනු ලැබේ. මාගධී ප්‍රාකෘතය පසුව පාළි භාෂාර්ථයෙන් බුද්ධ දේශනාවත් තත් අට්ඨකථාවනුත් පශ්චාත් පාළි කෘතිත් සම්පාදනය සඳහා ප්‍රධාන භාෂා මාධ්‍යය වශයෙන් භාවිතයට ගැණුනි. තත් කරුණු සියල්ල විමසීමෙන් වෛදික අවධියේ සිට සියවස් ගණනාවක් මුළුල්ලෙහි සංවර්ධනය වූ භාෂා ලක්ෂණ පාළි භාෂාව තුළ විද්‍යමාන වන බව පැහැදිලිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

01. *කාව්‍යාදර්ශය,* (2001), සංස්. වැලිවිටියේ පේමරතන හිමි, කොළඹ, සමයවර්ධන මුද්‍රණාලය.

02. *චුල්ලවග්ගපාළි II,* (2006), බුද්ධජයන්ති සංස්කරණ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

03. *ජාතකට්ඨකථා,* (1928). සංස්. විදුරුපොල පියතිස්ස හිමි, කොළඹ, ත්‍රිපිටක මුද්‍රණාලය.

04. *ජාතක අටුවා ගැටපදය,* (1943). සංස්, ඩී. බී. ජයතිලක, බොරැල්ල, ලංකාභිනව විශ්‍රැත යන්ත්‍රාලය.

05. *දාඨාවංස,* (1914). සංස්. අලුත්ගම සීලාලංකාර හිමි, සද්ධර්ම ප්‍රකාශ යන්ත්‍රාලය.

06. *දීඝනිකාය I,* (2006), බුද්ධජයන්ති සංස්කරණ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

07. *දීපවංසො,* (1959). සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

08. *ධම්මපදට්ඨකථා I,* (1919). සංස්. කහවේ රතනසාරථෙර, හේවාවිතාරණ මුද්‍රණය, ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.

09. *ධම්පියා අටුවා ගැටපදය,* (1947). සංස්. ඩී.ඊ. හෙට්ටිආරච්චි, පේරාදෙණිය.

10. *නිකායසංග්‍රහය,* (1984). සංස්. බන්දුසේන ගුණසේකර, කොළඹ, ඉන්දික මුද්‍රණාලය.

11. *මජ්ඣිමනිකාය I, III,* (2005). බුද්ධජයන්ති සංස්කරණ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

12. *මහාවග්ගපාළි II,* (2006), බුද්ධජයන්ති සංස්කරණ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

13. *රසවාහිනී,* (2004). සංස්. කැලිගම විජිතනන්ද හිමි, සීදේවි ඕෆ්සෙට්.

14. *රූපසිද්ධි,* (1964). සංස්. කළුකොඳයාවේ පඤ්ඤාසේඛර හිමි, කොළඹ, ගුණසේන මුද්‍රණාලය.

15. *විසුද්ධිමග්ග,* (1919). සංස්. පමුණුවේ බුද්ධදත්ත හිමි, හේවාවිතාරණ මුද්‍රණය, ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ.

16. *සන්දේහවිඝාතනි නම් වූ සන්නය,* (1934). සංස්. බද්දේගම ධම්මරතන හිමි, වැලිගම, සත්මිණ යන්ත්‍රාලය.

17. *සමන්තපාසාදිකා I,* (1929). සංස්. බද්දේගම පියරතන හිමි, කොළඹග

18. *සාරත්ථදීපනී ටීකා,* (1914). සංස්. බිහල්පොල දේවරක්ඛිත හිමි, විද්‍යාභූෂණ යන්ත්‍රාලය, කොළඹ.

19. *සුත්තනිපාත,* (2006). බුද්ධජයන්ති සංස්කරණ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

20. *සුමංගලවිලාසිනි,* (1918). සංස්. ධම්මකිත්ති සිරිදේවමිත් ත හිමි, හේමු, ත්‍රිපිටක මුද්‍රණාලය.

## ද්විතීයික මූලාශ්‍රය

01. ජයසේකර, ආනන්ද, (2000). *තුලනාත්මක වාග් විද්‍යාව,* කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

02. ඤාණානන්ද හිමි, මාදෝවිට, (1963). *සිංහල භාෂා ඉතිහාසය,* කොළඹ.

03. භරතසිංහ උපාධ්‍යාය, (2003). *පාලි සාහිත්‍යයේ ඉතිහාසය* (පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි) කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

04. විමලවංස හිමි, බද්දේගම, (1950). *බෞද්ධ සාහිත්‍ය*, අනුර මුද්‍රණාලය, කොළඹ.

05. විමල විජයසූරිය, (1968). *තුලනාත්මක බෞද්ධ සංස්කෘතිය,* නුගේගොඩ, රංජනී ප්‍රින්ට්ස්.

06. සුමංගල හිමි, කන්නිමහර, (1964). *පාලිභාෂා විමර්ශනය,* කොළඹ, රත්න පොත් ප්‍රකාශකයෝ.

07. හෙට්ටිආරච්චි, ඩී. ඊ. (1947). *ප්‍රාකෘත සංග්‍රහය,* කොළඹ, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

08. Chatterji, S.K. (1972). *The Origin and Development of Bengali Language*, Calcutta.

09. Franke, R.O. (1902). *Pali and Sanskrit*, Strassburg.

10. Geiger, W. (1943). *Pāli Literature and Language*, Calcutta

11. Ghatage, A.M., (1962). *Historical Linguistics and Indo-Aryan Languages*, University of Bombay.

12. Katre, S.M., (1964). *Prakrit Languages and their contribution to Indian Culture*, Pune, Decan College.

13. Kāsyapa Jagadīsa Bhikkhu, (1975). *Pāli mahā vyākaraṇa,* Bangkok, Thailand.

14. Macdonell, A. (1953). *A Vedic Grammar for Students*, London, Oxford University Press.

15. Norman, K.R. (1983). *A History of Indian literature*, Otto Harrassowitz, Wiesbaden.

16. Sukumar Sen, (1960). *A Comparative Grammar of Middle Indo-Aryan Languages*, Pune.

17. *The Āgamaśāstra of Gandapāda*, (1989). Vidhushekhara Bhattacharya, Delhi.

18. Taraporawala, (1962). *Elements of the Science of Language*, Calcutta.

19. Law, B.C., (1941). *A Manual of Buddhist Historical Traditions, Saddhamma Sangaha*, India.

20. Law, B.C., (1934). *A History of Pail literature*, Vol. I, London.

21. Rahula, Walpola, (1997). *Humer in Pali literature and other essays*, Buddhist Study and Research Institute, Kotte.

22. Rhys davids, T.W., (1903). *Buddhist India*, London

23. Vaidya,P.L., (1958). *Prakrit Grammar of Hemacandra*, Pune, Bhandarkar Oriental Research Institute.

24. Winternitz, M. (1933). *A History of Indian Literature II*, Calcutta.

25. Woolner, A.C., (1928). *Introduction to Prakrit*, Calcutta.

## ශබ්දකෝෂ

01. *අභිධානප්පදීපිකා,* (1998). සංස්. ආරියදාස සෙනෙවිරත්න, සමයවර්ධන මුද්‍රණය, කොළඹ.

02. *අභිධානප්පදීපිකා සූචි,* (1893). සංස්. වස්කඩුවේ සුභූති හිමි, කොළඹ.

03. *Buddhist Hybrid Sanskrit Grammar and Dictionary*, (1953). Ed. Franklin Edgerton, Vol. II, Yale University Press.

04. *Dictionary of Pāli Proper Names III,* (1997). Malalasekare, G.P., PTS, Oxford.

05. *Pāli English Dictionary*, (2004). Ed. T.W. Rhys davids, PTS, Oxford.

## අමුද්‍රිත නිබන්ධ

01. විජිතධම්ම හිමි, මැදගම්පිටියේ, (2010). *මධ්‍යකාලීන පාලි ව්‍යාකරණ සම්ප්‍රදායඃ රූපසිද්ධිය හා පයෝගසිද්ධිය පිළිබඳ තුලනාත්මක හා ඓතිහාසික අධ්‍යයනයක්*, අමුද්‍රිත නිබන්ධය, පේරාදෙණිය විශ්වවිද්‍යාලීයය පුස්තකාලය.